

# කච්චායන භේද

## භාවාර්ථ කෞමුදී

## කාත්‍යායනභේද වර්ණනාව



මේ පිරිවෙනේ උපාචාර්ය මාදම්පේ **සොමාරාම තිස්ස** ස්ථවිර පාදයන් වහන්සේ හා, මෙහි ආදියෙහි පටන් අවසානය දක්වා ඉතා සැලකිලිවන්තව කටයුතු කළ මේ පිරිවෙන්හි ආචාර්ය **බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති තිස්ස** හිමියන් ද, අප සහෝදර **රන්දෙඹේ විජිතාලොක තිස්ස** ස්වාමීන් වහන්සේ ද ගෞරවයෙන් සිහිකරමු.

මෙහි මුද්‍රණ වියදම් ආදිය දැරූ කොළඹ ප්‍රසිද්ධ ඉංග්‍රීසි වෛද්‍යාචාර්ය වරයෙක් වූ අපේ කෑපකරු දායක **එච්. ගේබ්‍රියෙල් ද සිල්වා** දෙස්තර මහතාට ද කෘතඥ වෙමින් දීර්ඝායුරාරෝග්‍ය සෙත් පතමු. තවද, ඉතා සුළු කාලයක දී කරනලද මෙහි නොයෙක් ඌනතාදිය ඇතිවිය හැකි බව හා මතුවරකදී ඒ ඌනතාදිය සම්පූර්ණකරන බවත් සඳහන් කරමු.

මෙයට—ලෝවැඩ කැමති,

**පාරුකොට ධම්මාරාම තිස්ස.**

ශ්‍රී බුද්ධ වර්ෂ 2482 ක් මතුයෙහි වූ
පොසොන් මස පුර අටවක් ලත් ශනිදින.
මහාචෛත්‍ය පිරිවෙන.
රන්දෙඹේ – අම්බලම්ගොඩ.

# ආචරිය පරම්පරානුස්සරණං.

1 අමරපුර නිකායං යො - සණ්ඨපෙසි ධ සඟගුණී,
ඤාණවිමල තිස්සාඛ්‍යං - සති සෙට්ඨං නමාමි තං.

2 තප්පදම්බුජසෙවීසු - පධානො බුධ සෙඛරො,
ධම්මාධාර මහානෙත්‍ර - ථෙර පාදොසි තං නමෙ.

3 කහවේ සිරි ඤාණාදි - නන්ද ථෙරො මහාමති,
පාසාදිකොසි සාධූහි - වණ්ණිතො තං නමාම හං.

4 කවිසෙට්ඨො මහා ගණී - කත්තා විබුධ සෙඛරො,
මහානෙත්‍රා සි විමල - සාර තිස්සො, නමාමි තං.

5 තස්ස සිස්සො ධුනා තස්මිං - මහානෙත්‍ර ධුරන්ධරො,
පඤ්ඤාමොලි යතින්දොසි - ජයතං කවිකෙසරො.

6 මරම්මවංසාවතංසො - ධම්මරක්ඛිත විස්සුතො,
අනුනෙත්‍ර මහාථෙර - පාදො විලසතං චිරං.

7 සද්ධම්ම විනයෙ ඡෙකො - සන්තවෙසො දයාධනො,
සාසනතිලකත්ථෙර - පාදො විජයතං සදා.

8 සද්ධො වාදී දයාලූ යො - පණ්ඩිතා චරි යුත්තමො,
සොමාලොකත්ථෙර පාදො - චිරං ජීවතු සො සුඛී.

9 විනෙතා සාසනෙ මං යො - වුඩ්ඪිං පාපෙසි සඟගුණී
ධම්මාධාරො මම ථෙරො - සිවං ඵුසතු සො සුධී.

10 පත්ථ නිරතා මය්හං - අඤ්ඤෙ චාපි යතිස්සරා,
මාතා පිතා දයො සබ්බෙ - චිරං ජීවන්තු දායකා.

11 දිවංගතා ථෙර පාදා - දයො සබ්බහිතෙසිනො,
අනුමොදිය පුඤ්ඤං තෙ - ඉමං පපොන්තු නිබ්බුතිං.

# කච්චායන භෙද.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

1 ජිත මාරාදිකං බුද්ධං – ධම්මං මොහ විධං සකං
වන්දිත්වා උත්තමං සඞ්ඝං – කච්චායනඤ්ච වණ්ණිතං.

2 කච්චායනස්ස භෙද 'හං – සප්පයොගං යථාරහං,
සොතු ජනාන මත්ථාය – පවක්ඛාමි සමාසතො.

3 කසි කාම්මා දිතා ඛ්‍යාපා – රෙත දිප්පති යො පිතා,
ඉති කච්චස්ස පුත්තො තු – තස්ස කච්චායනො මතො.

4 තෙනෙ ච කත සත්ථම්පි – කච්චායන න්ති ඤායති,
කච්චායනස්සි 'දං සත්ථං – තිමිනා වචන' ත්ථතො.

5 සත්ථං අට්ඨවිධං හොති – සන්ධි නාමං ච කාරකං,
සමාසං තද්ධිතා 'ඛ්‍යාතං – කිතකං උණ්ණකං ඉති.

6 සමාධියන්ති යං තත්ථ – අදස්සෙත්වාන මන්තරං,
වණ්ණකීනාව ධියන්ති – සන්ධි තෙන පවුච්චති.

7 සර බ්‍යඤ්ජන වුත්තානං – සන්ධීනඤ්ච වසා තිධා,
සරෙසු වා බ්‍යඤ්ජනෙසු – විහිතා සර බ්‍යජනා.

8 ගාථාසු වුත්තා'හා නත්ථං – වාචා සිලිට්ඨ තාය වා,
ලොපා 'ගමං කරිත්වාන – විහිතා වුත්තසන්ධිකා.

9 සන්ධි 'ධ විත්තං කිංසුධ – තඤ්ඤහි තස්ස මූසා භවෙ,
සෙය්‍යත්ථිකො පදමතො – ඉදං තෙසං නිදස්සනං.

10 ලොපා 'දෙසඤ්ච ආගමො – විකාරො පකතී තථා,
දීඝ රස්සවසෙනා'පි – සන්ධි සත්තවිධා මතා,

11 තයො තයො තයො ද්වෙ ද්වෙ – ද්වෙ ද්වෙ චෙව යථාක්කමං,
ති-ඌණවීසති සන්ධි – පණ්ඩිතෙහි විජානියා

12 සර බ්‍යඤ්ජන. බින්දූනං – වසෙන හි තයො මතා,
යස්සින්ද්‍රියානි චත්තාරො – මෙ ඉති සරලොපතො.

13 එවංස තෙ අග්ග්‍යාගාරං – ඉති බ්‍යඤ්ජන ලොපතො,
තාසාහතානි මතං නිග්ග – හීත ලොපං ඤාති විඤ්ඤුනා.

14 ම්‍යායං ත්‍යාහං සරා ’දෙසං – ඔතාඩො බ්‍යඤ්ජනො මතො,
තමහ නාති මතං නිග්ග – හීතා ’දෙස ඤාති විඤ්ඤුනා.

15 අතිප්පගො පරොචාති – සරා ගමො ති ඤායති,
බ්‍යඤ්ජනො නයිමස්සා ති – පුබ්බංගමං පරං මතං.

16 සර බ්‍යඤ්ජනතො චෙව – වෙ වෙ පුබ්බා විජාතියා,
තොපෙති ’දූහමි චචාදි – විකාරො ති විජාතියා.

17 සො ඉමනතු මතොපුබ්බං – ගමා ති පකතී මතා,
විකාරො පකතී චෙව – ඤාතුකාමෙන ජාතියා.

18 සතිද්දෙසා’තිද්දෙසෙන – වෙ වෙ පරා විජාතියා,
සන්ධීධා’ති සතිද්දෙසො – මුනී වරෙ පරො මතො,

19 යථරිව සතිද්දෙසො – හොචාදි අතිද්දෙසතො,
දීඝ රස්සප්පභෙදෙ වං – ඤාතුකාමෙන ජාතියා.

20 සරෙහෙව සරා පුබ්බා – ලූනානා වාචි පරා රමා,
බ්‍යඤ්ජනා වා ගමාවාචී – දීඝ රස්සාදි සම්භවා.

21 සාල වණ්ණ ව්‍යවධානෙ – සන්ධිනාම් න සම්භවෙ,
ගාථාසු දුතිය නෙතත – නයියාදි ච කාලිකා.

22 සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති – යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දතී දුක්ඛෙ – එස මග්ගො විසුද්ධියා.

23 සකිං එව මහාරාජ! – සබ්භි කුබ්බෙථ සන්ථවං,
ඉච්චාදිසු ච වණ්ණෙසු – ව්‍යවධානං විජාතියා.

24 පුඤ්ඤදානා ’නෙත හවෙය්‍යං – සුබුම වජ්ජිතො අහං,
වාචා සිලිටය්තා චා පි – පෙසුඤ්ඤ විගතො පි ච

**සපසමයොගං සන්ධිභෙදං සමත්තං.**

## නාමං.

25 අත්ථං නමනති නාමෙතාපි – ඉති නාමාති යානි වා,
එවං නමන භාවෙන – නාමං එකවිධං මතං.

26 එතන්වා ’ඛණ රූළ්හීනං – වසෙන දුවිධං මතං,
පංසු කූලිස නිස්සාදි – භාසිතං තං යථාක්කමං.

27 නාමනාමං සබ්බනාමං – සමාසං තද්ධිතං තථා,
කිතනාමන්ති විඤ්ඤූහි – නාමං පඤ්චවිධං මතං.

28 සාමූහිකඤ්ච පච්චෙකං – විකප්පඤ්ච සංයොගිකං,
සම්බන්ධිකං පටිපක්ඛං – නාමනාමං ඡධා මතං.

29 සාමූහිකං ඝට පටො – පච්චෙකං සාටඝ වෙළුයො,
විකප්පො ච දිසා කාලො – කණ්හ සප්පො සංයොගිකො.

30 සම්බන්ධිකො ගොතමා'දි – පටිකෙඛා කිසා'දයො,
සප්පයොගාති නාමාති – පණ්ඩිතෙහි විජානියා.

31 පයොගවන්තං වචනං – ගුණපුච්ඡා පමාණිකං,
සබ්බසබ්බං දිසා වත්ථා – සංඛ්‍යා කාලන්ති දසධා.

32 පයොගවන්තං යං තං හි – තුම්හා'මහ වචනං තථා,
නීල පීතං ගුණො නාම – පුච්ඡා කතර කතමං

33 අප්පං ථොකං පමාණන්තු – සබ්බසබ්බෙ තරං මතං,
දිසා පුබ්බා අපරා ච – දීඝ රස්සා 'දි අවත්ථා.

34 එකං වෙ ති චතු සඞ්ඛ්‍යා – කාලන්තු අතීතා 'දයො,
දසධා සබ්බනාමාති – සප්පයොගා විජානියා.

35 ලීනං අපාකටං අඞ්ගං – ලීන ඞ්ගමයතී ති වා,
ලිඞ්ගං නාමන්ති විඤ්ඤෙය්‍යං – නාම ලිඞ්ගං හි සාදිසං.

36 යා සා ච ඉත්ථියා ලිඞ්ගං – යො සො පුල්ලිඞ්ග මෙව ච
යං තං නපුංසකං චෙ ති – තිවිධං ලිඞ්ග ලක්ඛණං

37 ආවත්ථිකඤ්ච ලිඞ්ගිකං – නෙමිත්තිකා 'ධිච්ච සමුප්පන්නං,
වච්ඡො දණ්ඩීච තෙවිජ්ජො – සිරිවඩ්ඪනකො මතො.

38 ක්‍රියා ජාති ගුණං යාදි – වජ්ඣානන්ති වා චතුබ්බිධං,
පාචකො ච අසෙසා රාජා – තෙ විජ්ජො ච තිස්සා දයො.

39 සාමඤ්ඤ ගුණ කිත්තිම – ඔපපාතිකතො ථවා,
මහාසම්මතො තෙවිජ්ජො – නෙමියො චන්දිමා 'දිකො.

40 තිලිඞ්ග සෙවක මෙ කස්ස – චතු ප්පභෙද භාවතො,
චාදස පභෙදං ලිඞ්ගං – පණ්ඩිතෙහි විජානියං.

41 තත්ථා-ඉ-ඊ-උ-ඌ-ඔ-ති – ඡබ්බිධා ඉත්ථිය න්තතො,
අ-ආ-ඉ-ඊ-උ-ඌ-ඔ-ති – පුල්ලිඞ්ගා සත්තධා මතො.

42 නපුංසකො 'පි තථෙව – බින්දුවණ්ණොපි තිලිඞ්ගිකො,
ආවත්ථිකා දි භෙදෙන – අනන්තභෙදෙ විජාතියා.

43 ආකාරො–ඉ–ඊ–උ–ඌ–ති – පඤ්චධා ඉත්ථිය න්තතො,
අ–ආ–ඉ–ඊ–උ–ඌ–වෙ ති – ඡබ්බිධො පුල්ලිඞ්ගො මතො.

44 අ–ඉ–උ–ඉති තීනෙ ව – නපුංසකො විජාතියා,
ආවත්ථිකාදි භෙදෙන – ඡ පඤ්ඤාසා ති වුච්චරෙ.

45 නපුංසක මපි පුමංව – කත්වා අට්ඨසට්ඨි තිච,
එකෙ වදන්ති අත්තානං – ගහෙතබ්බං විජානතා.

46 ඡ පඤ්ඤාස 'ට්ඨසට්ඨි ච – චාධිකා නවුතී රිතා,
න්‍යාසෙ තද්දීපකො රූප – සිද්ධියඤ්ච යථාරහං.

47 වුත්තියන්තු "කිමත්ථන්ති" – පුච්ඡිතබ්බෙසු වීසු ච,
පරං සතිපි කත්වාන – පුබ්බන්තු සම්බන්ධං කරෙ.

48 පුබ්බං සතිපි කත්වාන – පරම්පි සම්බන්ධං කරෙ,
තීසු පි වීසුසන්තෙසු – එකං ව සම්බන්ධං කරෙ.

49 නාමවචන පුඤ්ඤෙන – නමත්තං නාමත්තං භවෙ,
සචාචාරාන ඤ්ච විඤ්ඤූනං – සංසරන්තා භවා භවෙ.

50 ලිඞ්ගවචන පුඤ්ඤෙන – ලීනත්ථො පාකටො භවෙ,
ලීනපඤ්ඤෙහා කථතො ච – සතිමා සීලතෙජසා.

**සප්පයොගං නාමභෙදං සමත්තං.**

---

## කාරකං

51 නිප්ඵාදෙති පදත්ථො යො – ගමන පචනා. දිකං,
ඉති සො කාරකො නාම – කාරකඤ්ඤූහි ජාතියො.

52 කාරකත්තා ක්‍රියා යෙව – සන්ති මුඛ්‍යන කාරකං,
දබ්බං ඝාතූ පචාරෙන – තදා ධාරණ භාවතො

53 සද්දො'පි අත්ථ චාරෙන – කාරකො 'ති පවුච්චති,
එවං නිප්ඵාද කාතෙතන – කාරකො 'කාවිධං භවෙ.

54 කත්තා සබ්බක්‍රියා බ්‍යාපි – සෙසං කම්මාදි කාරකං,
විසෙසක්‍රියා බ්‍යාපී'ති – කාරකං දුවිධං මතං.

55 කත්තු කම්මං ච කරණං – සම්පදාන ම ථාපරං,
අපාදානං ච ඔකාසං – කාරකං ඡබ්බිධං මතං.

56 කත්තා ච දුවිධො හොති – වුත්තා 'වුත්ත වසෙන ච,
පඨමෙන යුත්තො වුත්තො – අවුත්තො තතියෙන ච
පුරිසො ගච්ඡතී මග්ගං – ගරුළෙන හතො නාගො.

57 සයං හෙතු කම්මකත්තු – වසෙන තිවිධො භවෙ,
දත්තො කරොති කාරෙති – කුසූලො භිජ්ජතෙ සයං.

58 කම්මං හි දුවිධං හොති – වුත්තා 'වුත්ත වසෙන ච,
ඔදනො පච්චතෙ දත්තො – කටං කරොති ත්‍යා 'දිකං.

59 නිබ්බත්ති විකති ප්පත්ති – භෙදා කම්මං තිධා මතං,
රථං කරොති ඣාපෙති – කට්ඨා 'දිච්චං නමස්සති.

60 සන්තා සන්ත ජනනානං – වසෙන නිබ්බත්තී දුධා,
මාතා පුත්තං විජායී ති – පුඤ්ඤං සුඛං ජනෙති 'දං.

61 පරිච්චත්තා පරිච්චත්ත – කාරණා විකතී දුධා,
කරොති කට්ඨං අඟාරං සුවණ්ණං කටකං කරෙ.

62 පත්තිකම්මං විධා කාය – චිත්ත සම්පත්ති භෙදතො,
බුද්ධං වන්දති පූජෙති – ආදිච්චං ච නමස්සති.

63 ඉච්ඡිතා 'දි වසා කම්මං – තිධා භත්තඤ්ච භුඤ්ජති,
විසං ගිලති ගාමඤ්ච – ගච්ඡං සාළමූපාගමි.

64 කාරණං දුවිධං හොති – බාහිර 'ජ්ඣත්ත භෙදතො,
වීහිං ලූනාති දාත්තෙන – චක්ඛුනා චන්දමික්ඛතෙ.

65 චක්ඛාදිනා ච ඡබ්බිධං – රූපං පස්සති චක්ඛුනා,
සද්දං සොතෙන සුණාති – ගන්ධං ඝාණෙන ඝායති.

66 රසං සායති ජිව්හාය – කායෙන ඵොට්ඨබ්බං ඵුසෙ,
ධම්මං මනෙන ජානාති – ඉදං තෙසං නිදස්සනං.

67 සම්පදානං විධා කාය – චිත්ත පුබ්බක භෙදතො,
භික්ඛුස්ස චීවරං දෙති – බලිං නාරායනස්ස ච.

68 අනිරාකරණා 'රාධ – නබ්භනු 'ඤ්ඤවසෙන හි,
සම්පදානං තිධා වුත්තං – රුක්ඛ යාචක භික්ඛවො.

69 අපාදානං විධා කාය – චිත්ත පුබ්බක භෙදතො,
අපෙන්ති මුනයො ගාමා – පාපා චිත්තං නිවාරයෙ.

70 චලා 'චලවසෙනා 'පි – අපාදානං විධා මතං,
හත්ථික්ඛන්ධතො ඔරුය්හ – පණ්ණා පතන්ති රුක්ඛතො.

71 උද්දිට්ඨ විසයං තඤ්චි — උප්පන්න විසයං තථා,
අනුමෙය විසය ඤ්චෙව ති — අපදානං තිධා මතං.

72 අපෙන්ති මුනයො ගාමා — කුසූලා තණ්ඩුලං පචෙ,
පාටලිපුත්තකෙහි ච — අභිරූපතරා ඉමෙ.

73 ආධාරො චතුධා බ්‍යාපි — කො 'පසිලෙසිකො තථා,
වෙසයිකො සාමීපිකො — තිලා 'දිකං . නිදස්සනං.

74 බ්‍යාපිකො ච දුධා සකල — බ්‍යාපීකො 'ක දෙසතො,
තිට්ඨන්ති තෙලං තිලෙසු — ඛීරං ජලෙසු තිට්ඨති.

75 දුවිධො 'පසිලෙසො ච — අල්ලියා නාල්ලි භෙදතො,
උක්ඛලිය ඤ්චෙව ආචාමො — පරියබෙක ච තිට්ඨති.

76 වෙසයිකො ච දුවිධො — දෙසන්තර 'ඤ්ඤථා · වසා.
පාදෙසු පතිත්වා රොදි — පක්ඛන්ති සකුණා නභෙ.

77 සාමීපි යවනයං තීරෙ — සමීපෙ උපචාරතො,
ලඬං තීරෙන ගඞ්ගාති — ගඞ්ගායං සස්ස මා දිසු.

78 මුඛ්‍යො පරම්පරා තබ්බි — සයො නාදු පතිස්සයො,
ඛග්ගමහි පරියබෙකච — රූපෙ ච සාසනෙ වසි.

79 සාමි ආලපන ඤ්චෙව ච — නිද්ධාරණ ඤ්චෙව ලක්ඛණං,
හෙතු අච්චන්තසංයොගං — ඉමෙ අසාරසා මතා.

80 සාමි ආලපනං තත්‍ථ — නිධාරණ ම සාරසං,
ක්‍රියායෙ ච තෙසං යොගා — භාවතො තත්‍ථ 'පලක්ඛයෙ.

81 සාමිභෙදෙ අනෙකධා — ජනකා 'දි ප්පභෙදතො,
රඤ්ඤො පුත්තො ධනං හත්ථො — සවාචාර මාදි ඤායතෙ.

82 සජීවා ජීව භෙදෙන — දුවිධා 'ලපනං මතං,
හොති ඉත්ථි ච හො සෙල — ජාතිතබ්බං යථාක්කමං.

83 ජාති–ගුණ–ක්‍රියා–නාම — වසෙන චතුධා මතං;
ඛත්තියොච මනුස්සෙසු — සාමා නාරිසු දස්සනී.

84 පපීකෙසු ච ධාවන්තො — ආනන්දො සාවකෙ සවි ති,
සමූහා වයවං ජාත්‍යා — දිනා නිධාරණං මතං.

85 ලක්ඛණ–හෙතු–අච්චන්තං — ක්‍රියත්ථස්ස අභාවතො,
තං යොගෙ තං නිමිත්තෙන පි — සාරසා නති නාවුච්චති.

86 භාවො ච භාවවන්තං ච - ලක්ඛ්‍යවන්තං ච ලක්ඛියං,
කිරියං ලක්ඛණං පුබ්බං - පරන්තු ලක්ඛියං මතං.

87 තෙසං කත්තා ච කම්මඤ්ච - තබ්බන්තං නාමජාතියං,
ගොසු ච දුය්හ මානෙසු - ගතො දුද්ධෙසු ආගතො.

88 ජනකො සම්පාපකො හෙතු = ඤාපකො 'ති තිධා මතො,
බීජාය අඞ්කුරො ජාතො - තීරං නාවාය පාපුණි.

89 සභාවො බ්‍යතිරෙකො ච - කාරියො ඤාපකො තිධා,
උණ්හත්තා සිතත්තා අග්ගි - ධූමාය ත්‍වීති ඤායති.

90 කාල 'ඬාන වසා චෙ ති - අච්චන්ත සංයොගං මතං,
මාසඤ්ච යොජන 'ද්ධානං - සජ්ඣායතී 'ති ඤායති.

91 විසෙසනං විධා තෙසං - තුල්‍ය භින්න පපභෙදතො,
තිලොක මහිතො නාථො - ගොතෙතන ගොතමො භවෙ.

92 යස්ස 'ක්‍රත්‍ථ විභත්තිත්තං - ඒකසංඛ්‍යා ක්‍රියා පි ච,
සමාන ලිඞ්ගතා චෙව - තුල්‍යා 'ධිකරණං මත

93 ආයයා 'සයිභාවො ච - තබ්භාවො තබ්බිසෙසතා,
ධම්මාධාර ඵලානං ච - ඒකතා ති ජධා මතං

94 රතෙතා පටො සුවො සෙතො - කරී හත්‍ථී බුද්ධො ජිනො,
නීලො වණ්ණො අම්බො පානො - සීහො අනිල 'සෙසා නරො.

95 අම්බිලො ගරුකො හොති - ලහුකො කටුකො රසො,
ගද්‍රහතං සුසංයුත්තං - ඔසධං දුයුත්තං විසං.

96 නතියා චෙව ජට්ඨී ච - සත්තමී චෙති භෙදතො,
භින්නා 'ධිකරණා තත්‍ථ - තිවිධනති විජාතියා.

97 ගොතෙතන ගොතමො නාථො - ඒකූනතිංසා වයසා,
රක්ඛෙඤ්ඤ 'ච පුරිසො හොති - නසෙට්ඨී බ්‍රාහ්මණා 'දිනං,
ගෙහෙව තිසිතෙනා හොති - න සාලාදිසු බ්‍රාහ්මණො.

98 අට්ඨාරසහි සිප්පෙහි - සම්පන්නො ඉමිනා අහං,
කාරණෙහි සමානෙහි - චක්ඛුහු පගතො භවෙ.

**සසසයොගං කාරකභෙදං සමත්තං.**

---

## ස මා සො.

99 සමාසීයන්ති නාමානි - නාමානං සමසනං තථා,
සමාසො නාම විඤ්ඤෙයො - සමසන වසෙ 'කධා.

100 සමාසො ච විධා හොති - නිච්චා 'නිච්චසමාසතො,
අරින්දමො දීපඞ්කරො - මුනින්ද 'දි නිදස්සනං.

101 සමාසො ච ද්විධා හොති – ලුත්තා ලුත්ත වසා 'ථවා,
මුනින්ද ගොධනො චෙ ති – ගවම්පති නිදස්සනං.

102 සමාසො ච ද්විධා හොති – යුත්තා 'යුත්ත වසා 'ථවා,
නිදස්සනං මුනින්ද 'දි – අස්සද්ධ භොජනා 'දිකං.

103 සමාසො ච තිධා හොති – සද්ද 'ත්‍ථ භෙදතො පුන,
අස්සද්ධ භොජී උරසී – ලොමො නීලුප්පලා දිකං.

104 ආදි මජ්ඣුත්තරානං වා – ලොපතො තිවිධො භවෙ,
දත්තො අස්සරථො රූපං – ඉදං තෙසං නිදස්සනං.

105 පුබ්බු 'ත්තරූ භයඤ්ඤත්‍ථං – පධාන 'ත්‍ථපධානතො,
චතුධා තිලොකං රාජ – පුත්තො 'ජෙළු ස ගොධනො.

106 අබ්‍යයීභාවො–දිගු–ද්වන්ද – කම්මධාරය මෙ ව ච,
තප්පුරිසො බහුබ්බීහි – සමාසො හොති ඡබ්බිධො.

107 යථාරුචි තිලොකඤ්ච – සමණබ්‍රාහ්මණා 'දයො,
නීලු 'ප්පලං රාජපුත්තො – ලම්බකණ්ණො යථාක්කමං.

108 සත්තා 'බ්‍යයි යථාරුචා 'ධි – මාතරා 'ධිරූපකං,
යථාක්කමං නිබ්බානු 'ප – නගරං අධිනාවිකං.

109 දිගු ද්විධා සමාහාරා – සමාහාර වසෙන ච,
තිලොක නත්‍ථු සමාහාරං – පඤ්චි 'න්ද්‍රියානි චා 'සමා.

110 ද්වන්ද ද්විධා සමාහාර – ඉතරීතර යොගතො,
අජෙ 'ළකං සමාහාරො – සමණබ්‍රාහ්මණෙ 'තරො.

111 විසෙසන–පුබ්බ–පරූ – භය පදං සම්භාවනා,
උපමා 'වධාරණ ඤ්ච – කු–න–පා 'දි පුබ්බං නව.

112 නීලු 'ප්පලං යථා තංහි – යථාක්කමං ගණු 'ත්තමො,
සණ්හ සුඛුම ධම්මො ච – තථාව හෙතු පච්චයො.

113 සංඛ සෙතං ගුණො යෙව – ධනං ගුණධනං තථා,
කුපුත්තො තු අභාවො ච – පාවචනාන්ති ඤායති.

114 තප්පුරිසො ද්විධා හොති – පඨමා මා 'දිභෙදතො,
පඨමා, බ්‍රාහ්මණො හොති – අමා 'දි භූමියං ගතො.

115 පඨමා ච ද්විධා හොති – දිගු–තුල්‍ය 'ත්‍ථ භෙදතො,
අපඤ්චමූලි දිගු ච – තුල්‍ය 'ත්‍ථො ච අබ්‍රාහ්මණො

116 අමා 'දි ඡබ්බිධො හොති – දුතියා තතියා 'දිතො,
නිදස්සනං යථා තස්ස – එවං ඤෙය්‍යං විජානතා.

117 භූමිගතො දෙවදත්තො – කඨිනදුස්ස මාදිසො,
අත්තජො රාජපුත්තො – ගාමවාසී යථාක්කමං.

118 බහුබ්බීහි ද්විධා හොති – තග්ගුණා 'තග්ගුණ භෙදතො,
ලම්බකණ්ණො 'දි තග්ගුණො – පබ්බතා 'දි අතග්ගුණො.

119 අඤ්ඤපද පභෙදෙන – ආදි–මජ්ඣ–'න්තතො තිධා,
පත්තහත්ථො අනන්තො ච – ඡින්නහත්ථො යථාක්කමං.

120 සත්තවිධො බහුබ්බීහි – පඨමා 'දි වසා පන,
නිග්‍රොධ පරිමණ්ඩලො – ආගත සමණො තථා.

121 ජිතින්‍ද්‍රියො දින්නසුංකො – නිග්ගත ජනකො තථා,
ලම්බකණ්ණො සුසස්සො 'ති – යථාක්කමං විජානියා.

122 චන්දෙන දිගුනා කම්ම – ධාරයෙන සමුච්චයො,
තුල්‍යත්ථ වාචකා සෙසා – නාමා 'නුරූප වාචකා.

123 කම්මධාරයො චන්දො ච – තප්පුරිසො ච ලාභිනො,
තයො පරපදෙ ලිඞ්ගං – බහුබ්බීහි පද 'න්තරෙ.

124 දිගු වා 'බ්‍යයීභාවො ච – නපුංසකෙ 'ව නියතා,
වාචකා පන විඤ්ඤෙය්‍යා – විභත්ති–පද–රූපතො.

125 පුඤ්ඤනා 'නෙන සංසාර – සංඛෙප කාරකො භවෙ,
අභෙජ්ජ පරිසො පඤ්ඤො – සතිමා ච භවාභවෙ.

**සප්පයොගං සමාස භෙදං සමත්තං.**

## තද්ධිතං

126 තෙසං සද්දසමූහානං – හිතා 'නුකූලතං එවා,
තෙසං සිස්ස සමූහානං – තද්ධිත නාති පවුච්චති.

127 සාමඤ්ඤ–'බ්‍යය–භාවෙන – තද්ධිතං තිවිධං භවෙ,
සාමඤ්ඤං විවිධං තත්‍ථ – ලිඞ්ගෙහි වචනෙහි ච.

128 අබ්‍යයන්තු තථා නෙව – භාවො භාවෙත්‍ථ යුත්තකො,
වාසිට්ඨා'දි තථා තතාදි – ඔපම්මාදි නිදස්සනං

129 ගොත්ත-තර-රාග-ජාත්‍යාදි - සමූහ-ඨාන-නිස්සිතං,
උපමා-බහුලං-සෙට්ඨං - අස්ස'ත්ථි-පකති-පූරණං,
සංඛ්‍යා-විභාගං-සාමඤ්ඤං - පණ්ණරස විධං භවෙ.

130 වාක්‍යෙ තු විජ්ජමානස්ස - පදස්සා'ගමම ලොපනං,
නානි නාමානි ඤෙය්‍යානි - බුද්ධිමන්තෙහි තං යථා.

131 වාසිට්ඨං-නාවිකං-නීලං - පුරිමා-ජනතා තථා,
රජනීයං-දුට්ඨුල්ලං ච - ධූමායිතත්ත මෙව ච.

132 අභිජ්ඣාලූ ච සෙට්ඨො ච - සඞ්ඛො මණිමයං තථා.
පඤ්චමො ච වීකං විධා - ඉදං තෙසං නිදස්සනං.

133 ණො ණායනො ච ණානො ච - ණෙය්‍යො ණි ච ණිකො තථා,
ණවො ණෙරො ච ණ්‍යො වෙ ති - නව ගොත්ත පතිට්ඨිතා.

134 ණිකො ණියො ති වෙ යෙව - තරත්‍යා දිම්හි ජාතිතො,
ණො ච රාගෙ ඉම් 'කි 'යො - ජාතිම්හි චතුරො සියො.

135 සාණ්ණො නා සමූහෙති - ඨාණී යො ලො ච නිස්සිතෙ,
ආයිතත්තා උපමායං - ආලූ ච බහුලෙ තථා.

136 තර-තම්-'ස්සි-'කි-'යි-'ට්ඨා - පඤ්චෙ'තෙ විසිට්ඨෙ නව,
වි-සො-සි-ඉක-ඊ-රො-ණො - වන්තු මන්තු අස්සත්ථියං

137 මයො ච පකතියම්හි - පූරණෙ මී-ථ-ඨා-තියො,
සංඛ්‍යානෙ කො ච ධා සො - චෙ විභාගෙ පච්චයා සිතා,
සාමඤ්ඤෙ පච්චයා එවං - ඡත්තාළීස භවන්ති 'මෙ.

138 සික්කාය ධාරියො භාරො - යථා කාජෙන ධාරිතො,
විනෙන 'වං වචනත්ථාය - වාක්‍යමපෙක්ඛ භවන්ති තෙ.

139 වාක්‍යෙ තු විජ්ජමානානං - ලොපා පද විභත්තිනං,
දුවෙ අත්ථෙ වදන්තීති - පණ්ඩිතෙහි විජානියා.

140 මණි 'න්ධනා 'තපෙ අග්ගි - තම්හි නට්ඨෙ න නස්සති,
නට්ඨෙ පද විභත්තිම්හි - පච්චයත්ථං පවුච්චරෙ.

141 ථා-ච ථත්තාවි-ථං-තො-ත්‍ර - ථො-ධි වො හිං ච හං පිච,
හිංචනං හංචනං හිං ච - හො-ධො-දා-දානී-දාචනං.

142 වචී ච වචනං චා 'පි - රහාවී ච රහාචනං,
රහි-ධුනා-'ජ්ජ-ජ්ජු-ජො-ත්‍යඨ - වීසප්පච්චයා 'බ්‍යයෙ.

143 ණ්‍ය-ත්ත-තා-ත්තන-ත්තංත්වං-ණිලං ණිකං ණියං සාණ්ණො,
භාවෙ 'කාදස තිට්ඨන්ති - පඤ්චා'සීති සමූහතො.

144 භාවෙ තු භාවත්ථො නාම – ජාති ගුණ ක්‍රියා තථා,
තාමං දබ්බන්ති පඤ්චෙව තෙ – සද්දමන්තා විජාතියා.

145 ලභෙය්‍යං තෙන පුඤ්ඤෙන – අනුකූල මිත්තා 'දිකං,
කරෙය්‍යං පසත්ථං කම්මං – සද්ධාදි ඉන්ද්‍රියො භවෙ.

**සප්පයොගං තද්ධිතභෙදං සමත්තං.**

## ආඛ්‍යාතං

146 ජොතන්ති පච්චයා චෙත්ථ – ආඛ්‍යායන්ති විභත්තියො,
භාවං කම්මං ච කත්තාරං – ආඛ්‍යාතන්ති පවුච්චති.

147 අත්ථානං වාචකා තත්ථ – අට්ඨහොන්ති විභත්තියො,
පඤ්චමී වත්තමානා ච – සත්තමී ච හීයත්තනී,
අජ්ජතනී පරොක්ඛා ච – කාලාති භවිස්සන්ති ච.

148 තාසෙව 'කෙ 'කා ද්විධා හොන්ති – පරස්සපද මත්තනොපා,
පුබ්බෙ ඡ ඡ පරස්සාති – පරෙ ඡ ඡ ච මත්තනො.

149 තෙසෙව කෙ 'කා තිධා හොන්ති–නාම තුම්හා 'මහ යොගතො,
පුබ්බෙ මජ්ඣෙ පරෙ ද්වෙ ද්වෙ–නාම තුම්හා'මහ යොගිසා.

150 තෙසෙව කෙ 'කා තිධා හොන්ති – පුරිසභෙදතො පි ච,
පුබ්බෙ මජ්ඣෙ පරෙ ද්වෙ ද්වෙ – පඨම මජ්ඣිමු 'ත්තමා.

151 තෙසෙව කෙ 'කා 'පි ද්විධා – වචන භෙදතො පන,
තෙසු පුබ්බා පුබ්බා එකා – පරා තු බහුවාචකා.

152 විභත්ති ජාතිතො අට්ඨ – සොළස පදතො සියුං,
අට්ඨතාළීස යොගෙන – තථෙ 'ව පුරිසෙන ච.

153 ඡන්නවුතී 'ති හොන්ත්‍ය තෙ – වචනස්ස පභෙදතො,
පරො පුරිස භෙදෙන – අසීතී 'ති පකාසිතා.

154 ති–සි–ථ–ඤ්ච–ති–මි–ම–ඤ්ච – සි–මි–මං–ති–සි–මං–තථා,
ත්‍ය න්ති–සි–ථ–මි–ම ඤ්චෙව ති – පඤ්චවාරා පකාසිතා.

155 වත්තමානා පච්චුප්පන්නෙ – භවිස්සන්ති අනාගතෙ,
පඤ්චමී සත්තමී තීසු – අතීතෙ හොන්ති සෙසකා.

156 පරස්සපද මා ඛ්‍යාතං – කත්තුනො යෙව වාචකං,
අත්තනොපද මා ඛ්‍යාතං – භාවෙ කත්තරි කම්මනි.

157 ඛ-ඡ-සා-ආයි 'යා-ණෙ-ච - ණයො-ණාපෙ-ච ණාපයො,
අලො-ණයා-රා 'ලො යො ච - අකාරා වෙ ඉවණ්ණකා.

158 එ ඔ කාරා යො ණු ණා ච - උණා නා ච පප ණ්හා තථා,
ඔ සිරා ණෙ ණයා චෙති - පච්චයා එකතිංසි 'මෙ.

159 නෙසු ණෙ ච ණයො ණාපෙ - ණාපයො ච අලො තථා,
පඤ්චෙ 'තෙ කාරිතෙ යෙව - සෙසා අකාරිතෙ ඊතා.

160 ජොතකා පච්චයා තෙ ච - විකරණා පකාසිතා,
නිග්ගහීතඤ්චි 'වණ්ණා ති - ආගමා වෙ පකාසිතා.

161 භවෙය්‍යං තෙන පුඤ්ඤෙන - ස්වාක්ඛාත ධම්මිකො අහං,
බාලානං ජොතකො චෙව - සද්ධා බලාදිකො පිච.

**සප්පයොගං ආඛ්‍යාතභෙදං සමත්තං.**

---

## කිතකං

162 කඞ්ඛං කිරති සිස්සානං - හිතං වා යං පකාසති,
ඤාණස්ස හෙතු භූතං තං - කිතකානන්ති පවුච්චති.

163 කිතකං තිවිධං තත්ථ - කිත කිච්චු 'භයං සමා,
කත්තරි භාව කම්මෙසු - තීසු තෙ වාචකා මතා.

164 යො කරොතී 'ති කත්තා ච - පචීයතෙ ති පචිතා,
කාතවෙ ඉති කත්තුඤ්ච - ඉදං තෙසං නිදස්සනං.

165 තත්ථා 'කාරො ච ණො-ණ්වු-ච - ත්වා 'වී ක්වි රම්ම ණී යු රූ,
ණුකො රො තබ්බ වා 'නීයො - ණ්‍යා තෙය්‍යා රිච්ච යූ ති ච.

166 අ ති ච රිරියො තො ච - තාවී තවන්තු නා බ පි,
තවෙ තුං තුන ත්වාන ත්වා - මාන 'න්තා රිතු රාතු ච,
තුකො ඡත්තිංස සාමඤ්ඤ - නාමතො හොන්ති පච්චයා.

167 තෙසෙව කාරො තයො ණො ච - වතසෙසා ත්වා 'වියොදුවෙ,
රූ තා දුවෙ තයො යූති - පඤ්චතාළීස අත්ථතො.

168 තත්ථා 'කාරො ච ණො ණී ච - ත්වාවී රූ තො ණුකො වි'න්තො,
අන්තා රි තු දසෙතෙ ච - කත්තරි යෙව ඤායති.

169 තබ්බා 'නීයා ණ්‍ය රිච්චා ච - රිරියො වා 'පි පච්චයා,
පඤ්චිමෙ භාවකම්මෙසු - මානො කත්තරි කම්මනි.

170 සෙසා එකූ 'නවීසා ච — පච්චයා තීසු ජායරෙ,
තවෙ තුං තුන ත්වාන ත්වා - භාවෙ බ්‍යාකරණෙ මතා.

171 අන්තො තු වත්තමානම්හි — අතීතෙ තවන්තාදයො,
මානො තු වත්තමානා 'න්තා — ගතෙ සෙසා තිකාලිකා.

172 කත්තු කම්මඤ්ච කරණං — සම්පදාන මපාදානං,
අධිකරණ භාවො ති — සත්තධා සාධනෙන තු.

173 යො වාක්‍යෙ කාරකො කත්තා — පසිද්ධො සො ච ලබ්භති,
කත්තු සාධන මීරන්ති — සෙසෙ ස්ව පි අයං නයො.

174 උදාහරණ මෙතෙසං — කාප මනන්ති තු පුච්ඡියො,
කත්තු කම්මාදයො එව — දස්සෙතබ්බා යථාක්කමං.

175 වුත්තා 'වුත්තවසා කත්තු — ද්විධා බුද්ධො තු තිස්සයො,
සුද්ධ හෙතුවසෙනා 'පි — නාමං එව පකාසිතං.

176 ධාතු-ධාත්ව'ත්ථතො-වෙ ච — බුද්ධො සත්ථා පකාසිතා,
සපදා සපදතො වෙ ච — බුද්ධො එව පකාසිතො.

177 නාමා 'නුරූපතො චෙව — දස්සෙතබ්බා වච්චා පිච,
කිතක වාචකෙ සෙව ච — දස්සෙතබ්බා විජානතා.

178 භවෙය්‍යං තෙන පුඤ්ඤෙන — කඞ්ඛාවිතරණො සක්කා,
ලොභො දොසො ච මොහො ච — තනුකා ච භවාභවෙ.

**සප්පයොගං කිතකභෙදං සමත්තං.**

---

## නිට්ඨිතො කච්චායන භෙදො.

## භාවාර්ථ කෞමුදී

# කාත්‍යායනභෙද වර්ණනාව.

---

කච්චායන භෙදය නම් ග්‍රන්ථය කැටැවි වූ ශ්‍රීමත් **"යස"** ස්ථවිර පාදයෝ ග්‍රන්ථාදියෙහි ඉෂ්ට දෙවතානුස්මරණය කරන්නාහු **"ජිනමාරාදිකං"** යනාදිය කීහු.

**"අහං බුද්ධං වන්දිත්වා කච්චායන භෙදං පවක්ඛාමි"** යනු ක්‍රියාකාරක පදසම්බන්ධය යි.

1–2 **භාවය:–** පස්මරුන් දිනූ බුදුන් හා අවිද්‍යාන්ධකාරය නැති කරන ධර්මය ද, උතුම් සඞ්ඝයා ද, බුදුරදුන් ගුණ වැනූ මහා කච්චායන ස්ථවිරයන් ද වැඳ ආධුනිකයන් ගේ ප්‍රයෝජනය පිණිස උදාහරණ සහිත වූ මේ **කච්චායන භෙදය** සැකෙවින් කියන්නෙමි.

**වර්ණනා:–** මේ ගාථාවයයෙන් මඞ්ගලාචරණය හා ග්‍රන්ථ ප්‍රයෝජනය ද දක්වා ලූ හ. **"සර්වකර්මණි කුර්වීත ප්‍රණිපත්‍යෙෂ්ට දෙවතාම්"** යනු පුරාණෝක්ති හෙයින් තමන් කරන හැම සුබ වැඩකදීම පළමුකොට ඉටුදෙවියන් සිහිකිරීම පෙරදිග නුවණැති යන් ගේ ගතියකි. මෙහිදී ද ඔහු ඒ මග ගත්හ.

**"කච්චායන භෙදං"** යන්නෙන් සංඥාව ද, **"සොතුජනානං"** යන්නෙන් නිමිත්තද, **"අහං"** යන්නෙන් කර්තෘද, **"සප්පයොගං-යථාරහං-සමාසතො"** යන පදයන් ගෙන් ග්‍රන්ථ ප්‍රමාණය ද, **"අත්ථාය"** යන්නෙන් ප්‍රයොජනය ද, යන සංඥාදි අර්ථ පඤ්චකය මේ ගාථාවයයෙන් දැක්වූ හ.

3 **භාවය:–** යමෙක් සීසෑම් ආදියම කෙරේය යි රටේ පැතුරුනේ ද හේ කච්ච නම්. කච්චගේ පුත්‍ර කච්චායන නමැ යි හඳුන්වති.

**වර්ණනා:–** දිවි පැවැත්ම පිණිස ගවයන් රැකීම- වෙළඳාම ආදිය නොකොට සී සෑම් ආදිය කරන තැනැත්තේ ක**ච්ච** නමින් ප්‍රකට විය. ඒ කච්ච නම් තැනැත්තා ගේ පුත්‍රයා කච්චායන නම් විය. මහා කාත්‍යායන රහතන් වහන්සේ ගේ පියා ගොවියෙකි. ඒ නිසා උන්වහන්සේ ඒ නමින් පළවීම යුක්ති යුක්ත වේ.

කචති: (කසිකම්මාදිනා) දිප්පතීති= කච්චො, කච්චස්ස අපච්චං; කච්චායනො. "කච-දිත්තියං" යන ධාතුයෙන් සිද්ධ නාමයෙන් පරව අපත්‍යාර්ථයෙහි **"ණායන ණාන වච්ඡාදිතො"** යන සූත්‍රයෙන් වූ **ණායන** ප්‍රත්‍යයෙන් සිඩසි.

4 **භාවය:-** කච්චායන තෙරුන් කළ ව්‍යාකරණ පොතද ගත් කතුවරයා ගේ නමින් ම පළවිය. කච්චායනස්ස ඉදං= කච්චායනං. මෙය කච්චයාගේ ය යන තද්ධිත වචන වසයෙනි.

**වණ්ණනා:-** යමක් නිපද වූ තැනත්තා ගේ නමින් ම ඇනම් දෙය ප්‍රකටවීම සිරිතකි. **මොග්ගල්ලායන"** හිමියන් කළ වියරණ පොත **"මොග්ගල්ලායන"** යන නමින් පළවිය. **"මහිසස්ස ඉදං= මාහිසං"** යනු ව්‍යාකරණකාරයන් මෙහිදී ගත් මගය. **"ණ රාගා තෙන රත්තං තස්සෙද මඤ්ඤත්‍රෙප්සු ච"** යනු ඔවුන් ඒ පිණිස දක් වූ සූතුරය. මේ රීති අනුව කච්චායනය යනු පළවීම සහෙතුක මැයි.

5 **භාවය:-** යථොක්ත නිරුක්ති ග්‍රන්ථයෙහි සන්ධි, නාම, කාරක සමාස, තද්ධිත, ආඛ්‍යාත, කිතක, උණාදික යැයි ව්‍යාකරණ ක්‍රම අටක් වේ.

6 **භාවය:-** දක්ෂ වඩුවකු යම්සේ ලී දෙකක් සැස-කපාගෙන අතරක් නොපෙනෙණ ලෙස එකට සම්බන්ධ කෙරේ ද? එමෙන් පද දෙකක් අතර නොපෙනෙණ සේ ලොපාදෙසාදියෙන් එකට ගැළපීම සන්ධි නම් වේ.

**වණ්ණනා:-** සන්ධිය මේ ආකාර යැයි හඳුන්වන **"යස"** ස්ථවිර පාදයෝ ව්‍යක්ත උදාහරණයෙකින් එය දක්වාලූහ. වර්ණයෙන් හා කාලයෙන් බාධාවක් නොමැති යම්කිසි පද දෙකක් ලොපා දෙශාගමාදියෙන් එකතුකොට එක පදයක් සේ ගළපා කීම සන්ධි නමි. වඩුවා ලී පුරුද්දන්නාක් මෙනි. හේ වෙනස් වූ ලී දෙකක් යතු ගා-කපා මනාව අතරක් නොපෙනෙණ ලෙස ගලපයි. වර්ණයෙන් හා කාලයෙන් බාධා ඇති තැන සන්ධි නොවේ.

**වර්ණ ව්‍යවධානය** = අකොකාවජ්ජිම "ං" + අවඩි මං
**කාල ව්‍යවධානය** = "ජනා + අප්පමාදං,

7–8 භාවය:– සවරසන්ධි, ව්‍යඤ්ජනසන්ධි, වෘත්තසන්ධිය යි සන්ධි තුනෙකි. ස්වරයන් පිළිබඳ ලොපආදෙසා'ගමාදිය වීමෙන් සිදුවන සන්ධි සවරසන්ධි නමි. ව්‍යඤ්ජනයන් සම්බන්ධී ලොපාදිය වීමෙන් සිදුවන සන්ධි ව්‍යඤ්ජනසන්ධි නමි. ඡන්දස රැකගැනීම පිණිස හෝ වාක්ශලිෂ්ටතාවය පිණිස කරන සන්ධි වෘත්තසන්ධි නමි.

9 භාවය:– සුගමයි.

**වණ්ණනා**:– සබ්බා + ඉධ= **"සරාසරෙ ලොපං"** යන සූත්‍රයෙන් පූර්ව සවරලොපය හා **"දීඝං"** යන සූත්‍රයෙන් පරසවර දීර්ඝය වීමෙන් **"සබ්බීධ"** යි සිඬයි. සවරසන්ධියට උදාහරණයි.

කිංසු + ඉධ= **"වා පරො අසරූපා"** යන සූතුරෙන් පරසවර ලොපය හා "**පුබ්බො ච**" යන සූතුරෙන් පූර්වසවර දීර්ඝවීමෙන් "**කිංසූධ**" යනු සිඬයි. මේ ද සවරසන්ධියට ම උදාහරණයෙකි.

තං + හි= "**එහෙඤ්ඤං**" යන සූත්‍රයෙන් හකාරය පරකල්හි බින්දුවට ඤකාරාදෙශවීමෙන් "**තඤ්හි**" යනු සිඬවිය. ව්‍යඤ්ජන සන්ධියට උදාහරණයි.

සෙය්‍යත්‍ථිකො + අක්ඛර පදමතො=**"යදනුපපන්නා නිපාතනා සිජ්ඣන්ති"** යන සූත්‍රයෙන් **වසන්තතිලකා** වෘත්තාගත ලක්ෂණ රැකීම පිණිස අක්ඛර ශබ්දලොපයෙන් "සෙය්‍යත්‍ථිකො පදමතො" යනු සිඬවී. වෘත්ත සන්ධියට උදාහරණයෙකි.

10 **භාවය**:– යථොක්ත සන්ධිය ලොපසන්ධි, ආදෙශසන්ධි, ආගමසන්ධි, විකාරසන්ධි, ප්‍රකෘතිසන්ධි, දීර්ඝසන්ධි, හ්‍රසවසන්ධිය යි සප්ත විධ වේ.

**වණ්ණනා**:– ලොපආදෙශාග'මාදි වශයෙන් සන්ධි (7) සතකි.

| සන්ධි. | උදාහරණ. | සන්ධි. | උදාහරණ. |
|---|---|---|---|
| 1 ලොපසන්ධිය= | **සබ්බීතියො** | 4 විකාරසන්ධිය= | **බන්ධුස්සෙව** |
| 2 ආදෙශසන්ධිය= | **සබ්බස්ස** | 5 ප්‍රකෘතිසන්ධිය= | **ආනන්ද + අනිච්ච සඤ්ඤා** |
| 3 ආගමසන්ධිය= | **අතතදත්‍ථං** | 6 දීර්ඝසන්ධිය= | **ආනීධ** |

7 හ්‍රසවසන්ධියට "**යථරිව**" යනු උදාහරණයි.

**භාවය:**– ලොපසන්ධි තුන (3) ක් ද, ආදෙශසන්ධි තුන (3) ක් ද, ආගමසන්ධි තුන (3) ක් ද, විකාරසන්ධි දෙක (2) ක් ද, ප්‍රකෘතිසන්ධි දෙක (2) ක් ද, දීර්ඝසන්ධි දෙක (2) ක් ද, හ්‍රස්වසන්ධි දෙක (2) ක් දැයි යථොක්ත සප්තවිධසන්ධිය සතළොස් (17) වැදෑරුම් වේ.

12–13– **භාවය:**– ස්වරලොප, ව්‍යඤ්ජනලොප, නිග්ගහීතලොප යයි ලොපසන්ධිය ත්‍රිවිධ වේ. 1 "යස්සින්ද්‍රියානි" – "චත්තාරොමෙ" යනු ස්වරලොපසන්ධියට ද, 2 "එවංස" – "අගය්‍යාගාරං" යනු ව්‍යඤ්ජන ලොපසන්ධියට ද, 3 "තාසාහං" යනු නිග්ගහීතලොප සන්ධියට ද උදාහරණය යි දතයුතු වේ.

**වණ්ණනා:**– ස්වර ලොප්වීමෙන් සිදුවන සන්ධි ස්වරලොපය යි ද, ව්‍යඤ්ජන ලොප්වීමෙන් සිදුවන සන්ධි ව්‍යඤ්ජනලොපය යි ද, නිග්ගහීතය (බින්දුව) ලොප්වීමෙන් සිදුවන සන්ධි නිග්ගහීතලොපය යි ද, වෛයාකරණයෝ හැඳින් වූ හ.

1 යස්ස × ඉන්ද්‍රියානි= "**සරා සරෙ ලොපං**" යන්නෙන් පෙර සර ලොප්වීමෙන් "**යස්සින්ද්‍රියානි.**" යනු සිදුවිය. ස්වරලොපයට උදාහරණයි.

2 එවං × අස්ස= "**පරො වා සරො**" යන සූත්‍රයෙන් පරස්වර ලොපය හා "**ව්‍යඤ්ජනො ච විසඤ්ඤොගො**" යන්නෙන් විසංයුක්ත ආදි සකාරලොපයද වීමෙන් "**එවංස**" යනුසිදුවේ. ව්‍යඤ්ජනලොපයට උදාහරණ යි.

3 තාසං × අහං= "**ක්වචිලොපං**" යන්නෙන් නිග්ගහීතලොපය හා "**දීඝං**" යන්නෙන් දීර්ඝද වීමෙන් "**තාසාහං**" යනු සිද්ධවිය. නිග්ගහීතලොපයට උදාහරණ යි.

14 **භාවය:**– ආදෙශසන්ධියද, ස්වරාදෙශ–ව්‍යඤ්ජනාදෙශ–නිග්ගහීතාදෙශය යි ත්‍රිවිධවේ. ම්‍යායං=ත්‍යාහං, ඔනද්ධො, තමහං යනු උදාහරණයි.

**වණ්ණනා:**– 1 මෙ + අයං= "**යමෙදන්තස්සාදෙසො**" යන සූත්‍රයෙන් එකාරයට යකාරාදෙශය හා "**දීඝං**" යන්නෙන් දීර්ඝවීමෙන් **ම්‍යායං** යනු සිද්ධයි. ස්වරාදෙශ සන්ධියට උදාහරණ යි.

2 අව × නද්ධො= "**ඔ අවස්ස**" යන සූත්‍රයෙන් ඔකාරාදෙශ වීමෙන් **ඔනද්ධො** යනු සිද්ධවිය. ව්‍යඤ්ජනාදෙශසන්ධියට උදාහරණයි.

3 තං × අහං= "මදාසරෙ" යන සූත්‍රයෙන් නිග්ගහීතයට මකාරා දෙශවීමෙන් තමහං යනු සිද්ධවිය. නිග්ගහීතාදෙශ සන්ධියට උදාහරණයි.

15 භාවය:- ආගමසන්ධි තුනෙකි. ස්වරාගම සන්ධි-බ්‍යඤ්ජනාගම සන්ධි-නිග්ගහීතාගම සන්ධි යි. 1 අතිප්පගොබො- 2 තයිමස්ස 3 පුබ්බංගමං යනු උදාහරණයි.

වණ්ණනා:- අතිප්ප × බො= "ක්වචිඔබ්‍යඤ්ජනෙ" යන සූත්‍රයෙන් ඔකාරාගම හා "යවමදනතරලා චාගමා" යන්නෙන් ගකාරාගමද වීමෙන් "අතිප්පගොබො" සී සිද්ධයි. ස්වරාගමසන්ධියට උදාහරණයි.

2 ත + ඉමස්ස= "යවමදනතරලා චාගමා" යන්නෙන් යකාර ආගම වීමෙන් "තයිමස්ස" යනු සිද්ධවිය. ව්‍යඤ්ජනාගම සන්ධියට උදාහරණයි.

3 පුබ්බ + ගමං= "නිග්ගහීතඤ්ච" යන සූත්‍රයෙන් නිග්ගහීත (බින්දු) ආගමවීමෙන් "පුබ්බංගමං" යනු සිද්ධයි. නිග්ගහීතාගම සන්ධියට උදාහරණයි.

16-17 භාවය:- ස්වර විකාරසන්ධිය, බ්‍යඤ්ජන විකාරසන්ධිය යි විකෘතිසන්ධි දෙකෙක් වේ. ප්‍රකෘති සන්ධිය ද ස්වර ප්‍රකෘතිය, බ්‍යඤ්ජන ප්‍රකෘති ය යි විවිධ වේ. "නොපෙති-එකමිදාහං" යනු විකෘති සන්ධීන්ට ද, "කො ඉමං-මනො පුබ්බඞ්ගමා" යනු ප්‍රකෘති සන්ධීන්ටද ක්‍රමයෙන් උදාහරණයි.

18-19 භාවය:- සනිද්දෙස, අනිද්දෙස ය යි හ්‍රස්ව සන්ධියෙහි භෙද දෙකක් ද, සනිද්දෙස දීඝ, අනිද්දෙස දීඝ ය යි දීඝසන්ධි දෙකෙක් ද වෙති.

| සන්ධි | උදාහරණ |
|---|---|
| 1 සනිද්දෙස දීඝ | සද්ධීධ |
| 2 අනිද්දෙස ,, | මුනීචරෙ |
| 1 සනිද්දෙස හ්‍රස්ව | යථරිව |
| 2 අනිද්දෙස ,, | භොවාදි (ගුණෙන) |

20 භාවය:- අටවැදෑරුම් ස්වරයන් පරකල්හි ලොප්කරන ලද පූර්වස්වරයෝ සූසැටෙ (64) කි. පරස්වරයෝ දෙපනසෙ (52) කි.

ආගම වන්නා වූ ව්‍යඤ්ජනයෝ ද සිව්සැට (64) කි. (ආදෙශ, ආගම, විකාර, ප්‍රකෘති, දීඝ, හ්‍රස්ව) යන මොහු ලැබෙන පිළිවෙලින් ගණන් ගත යුත්තාහ.

**වර්‍ණනා:-** අකාරය පරකල්හි ...ාරය ආදි ස්වර අටද, එසේම ආකාරාදි ස්වර පර කල්හිද පූර්වස්ව... ...ස් ලොප් වෙති. ඔහු සූසැටක් මේ අයුරින් ලැබෙති. "**සරා ...ෙ ලොපං**" යන සූත්‍රයෙන් මොවුන්ගේ ලොපය වන බව ද ...තුයි. අකාරයා කෙරෙන් පරවූ ආ, ඉ ආදි සපත ස්වරයන්... ලොපයෙන් පරස්වරලොප සන්‍ධි දෙපනසෙක් දක්නා ලැබේ. "... **පරො අසරූපා**" යන්නෙන් මොවුන්ගේ ලොපය වේ.

21 **භාවය:-** කාලයෙන් හා වර්‍ණයෙන් බාධාවක් ඇති කල්හි සන්‍ධිකාර්‍ය නොවේ. ගාථාවන්හි දෙවන පාදයාගේ අන්ත්‍යාක්‍ෂරය හා තෙවන පාදයේ ආද්‍යක්‍ෂරය කාලයෙන් අතර ඇත්තේය.

25–23 **භාවය-** සරලයි.

**වර්‍ණනා-** මෙහි "ස කිං එව" යන තන්හි ස්වරයා පරකල්හි ඉවර්‍ණයට යකාරාදෙශය නියමිතවුවත් නිගෘහීතය තන්මධ්‍යයෙහි පැනෙන හෙයින් සන්‍ධි නොවිය. (6) වනගයට ලියූ වර්‍ණනාව බලනු.

24 **භාවය:-** මා ප්‍රයොග සහිත වූ සන්ධි භෙද දැක්වූ පිනෙන් සියුම් ජිව්වර්‍ණ ඇත්තෙක් වෙම්වා! වාක්ශ්ලිෂ්ටතායෙන්ද යුක්තවෙම්වා! පෛශුන්‍ය වචන නැත්තෙක් ද වෙම්වා.

**උදාහරණ සහිතවූ කච්චායන භෙදයෙහි සන්‍ධි කාණ්ඩය නිමි.**

---

## නාමභෙද.

**භාවය:-** යම් පද කෙනෙක් අර්‍ථය කරා තමා (වාචකත්ව යෙන්) නැමෙත් ද, තමා (වාච්‍යත්වයෙන්) අර්‍ථය හෝ නම්වත් ද, එබඳු පදයෝ නාම නම් වෙති. මෙසේ නැමීම් භාව ලක්‍ෂණයෙන් (පුරිෂාදි) නාමය එකවිධ වේ.

**වර්‍ණනා:- නාම.** නම=නම්නෙ යන ධාතුහු කෙරෙන් පරව "ණ" ප්‍රත්‍යය වීමෙන් සිද්ධවූ කිතක පදයෙකි. නාමය හඳුන්වන

අනුභූති ස්වරූපාචාර්යයෝ "විභත්තිරහිතං ධාතුවර්ජිත ස්වාර්ථ වචඃශබ්දරූපං නාමමුච්‍යතෙ." යි විභක්ති රහිතවූ ධාතු වෙන් තොර වූ අර්ථවත් ශබ්ද රූපය නාම නමැයි පැවසූහ. හුදු ධාතුවත් ප්‍රත්‍යයත් එකතුවීමෙන් සිඩවූ ශබ්ද සවරූපය අර්ථවත් විය හැක. එබඳු බුඩ යනාදිය නාමයයි හැගේ. නාම යනු ද්‍රව්‍යයට නමෙකැ යි වුඩසප්‍රියාචාර්යයෝ "නාමං දබ්බාභිධානං" යි කීහ.

**නැමීම් භාවය:**– යම්කිසි ද්‍රව්‍යාදියක් දැක්මෙහි හෝ, එබන්දක් පිළිබඳ ඇසීමෙහි හෝ, ඒ අභිධාන අභිධෙයයන් අනුව මේ කුමක් දැයි සිතන තැනැත්තාගේ සිත පළමුවෙන් ඒ අර්ථය කරා නැමෙන බැවින්, ගව–පුරුෂ ආදී පදාර්ථයකැ යි බුඩිය ඇතිවේ, එය අර්ථය කරා නැමීම් භාවය වේ. එසේ නැමෙන ගව ආදී පදය **නාම** නම්.

26 **භාවය:**– එකාවිධ වූ නාමය **අන්වර්ථනාමය–රූඪිනාමය** යි දෙපරිදි වේ. පංසුකූලිකො–තිස්සො යනු පිළිවෙළින් උදාහරණයි.

**වණ්ණනා:**– **අන්වර්ථ නාමය**–අර්ථයට අනුව පවත්නා නාමය අන්වර්ථ නාමයයි. පංසු වියාති = පංසු, පංසුවියකූලො=පංසුකූලො, පංසුකූලං ධාරෙතීති **පංසුකූලිකො**. පස් මෙන් සලකාගත් රෙදිවලින් කළ සිවුරු දරන්නා පංසුකූලික නම්. මෙය අන්වර්ථ නාමයට උදාහරණයි.

**ආරූඪ නාමය:**– අර්ථයට අනුව නො පවත්නා නාමය ආරූඪ (රූළ්හ) නාමයයි. **තිස්සො** යනු උදාහරණයි. තිස්ස යනු අර්ථයක් නොසලකා උප චාර වශයෙන් ගෙන කියන නමකි,

27 **භාවය:**– නාමනාමය. සබ්බනාමය, සමාස නාමය, තඬිත නාමය, කිතක නාමයයි නාම ලක්ෂණ දන්නා ප්‍රාඥයන් විසින් නාමය පස් ආකාරයකින් දක්වා තිබේ.

28–29–30 **භාවය:**– සාමුහික, පච්චෙක, විකප්ප, සංයොගික, සම්බන්ධික, පටිපක්ඛ නාමය යි නාම නාමයෙහි භෙද සයෙකි.

| **නාම** | | **උදාහරණ** |
|---|---|---|
| 1 සාමුහික | නාමය | **ඝට–පට.** |
| 2 පච්චෙක | " | **කණ–වෙළුයො.** |
| 3 විකප්ප | " | **දිසා–කාල.** |
| 4 සංයොගික | " | **කණ්හ–සප්ප.** |
| 6 සම්බන්ධික | " | **ගොතමො.** |
| 6 පටිපක්ඛ | " | **කිසො–ථූලො.** |

මෙසේ උදාහරණ සහිත වූ ෂඩ්විධ නාම නාමය පණ්ඩිතයන් විසින් දතයුත්තාහ.

**වර්ණනා:**- අර්ථය කෙරේ නැමේනුයි නාම නම් වේ. ඒ නාම යම් නාමය වීනුයි **නාම නාම** නම් වේ. **සඤ්ඤානාමය** යි ද කියති. නොයෙක් ද්‍රව්‍ය සමූදයෙහි ඇතිවූ නාමය **සාමූහික** නම්. එක එක ධර්ම කොඨාශය විෂයකොට ඇති නාමය **පච්චෙක** නම්. විකල්ප වශයෙන් ඇතිවූ නාම **විකප්ප** නම්. කිසියම් ගුණයකින් යුක්තවූවක් ප්‍රකාශ කරන නාමය **සංයෝගික** නම්. යම්කිසි ගොත්‍රාදියකගේ සම්බන්ධයෙන් ප්‍රකාශ කරන නාම **සම්බන්ධික** නම්වේ. එකිනෙකට විරුඬවූ නාමය **පටිපක්ඛ** නම්.

31-32-33-34 **ගා- සර්වනාමය:**- පයොගවනත සර්වනාමය- වචන- ගුණ- පූරණ-පමාණික- සබ්බසබ්බ- දිසා- අවත්ථා-සඞ්ඛ්‍යා- කාලයයි දස වැදෑරුම් වේ.

| සර්වනාම | | උදාහරණ |
|---|---|---|
| 1 පයොගවනත සර්වනාමය. | | යං, තං. |
| 2 වචන | ,, | තුම්හ, අම්හ. |
| 3 ගුණ | ,, | නීල, පීත. |
| 4 පූරණ | ,, | කතර, කතම. |
| 5 පමාණික | ,, | අප්ප, ථොක. |
| 6 සබ්බ සබ්බ | ,, | ඉතර. |
| 7 දිසා | ,, | අපර. |
| 8 අවත්ථා | ,, | දීඝ, රස්ස. |
| 9 සඞ්ඛ්‍යා | ,, | එක, චතු. |
| 10 කාල | ,, | අනික. |

**වර්ණනා;**- ලිඞ්ගත්‍රයට තුල්‍යාධිකරණ විශෙෂණව යෙදෙන නාම **සර්වනාමයයි** දතයුතුයි. ඇතැම්හු ලිඞ්ගත්‍රයෙහි වරනැගෙන නාම සර්වනාම යයි යෙති. පසුව කී මතය ප්‍රශස්තතර නොවේ. එසේ සැලකෙන කල "තාට-පුමා"දි ශබ්ද ද, සර්වනාම සඞ්ඛ්‍යාවෙහි ලා ගිණිය යුතු හෙයිනි.

**බාලාවතාර කතෘතුමෝ** සර්වනාම ශබ්ද දෙවිස්සක් දැක්වූ හ. **බුඬප්ප්‍රියාචාර්යයෝ** සර්වනාම සත්විස්සක් දැක්වූ හ, සබ්බ-කතර-කතම-උභය-ඉතර-අඤ්ඤ-අඤ්ඤතර-පුබ්බ- පර- අපර- දක්ඛිණ

උත්තර-අධර-යත-එත-ඉම-අමු-කිං-එතෙ-උභ-වි-ති-චතු-තුම්හ අම්හ යන සත්විස්සයි. එසේ සත්විස්සක්වූ සර්වනාම යථොක්තා කාරයෙන් කොටස් දශයකට ඇතුළත් වේ.

35 භාවය:- අප්‍රකට වූ අවයවය ලිඞ්ග නම්. නොහොත් අප්‍රකට භාවයට පමුණුවානු සි ලිඞ්ග නම්. නාමය යනු ලිඞ්ගයට වේවචනයෙකි.

වණ්නා:- **ලිඞ්ග**- කෙවලධාතු හෝ ප්‍රත්‍යය හෝ විභක්ති නොවූ අර්ථවත් ශබ්ද රූපය ලිඞ්ගය වේ. "ධාතුප්පච්චය විභත්ති වජ්ජිතමත්‍ථයුත්තං සද්දරූපං ලිඞ්ගං නාම" සි **ධර්මකීර්ති පාදයෝ** ඒ කිහ. "බුධ" යනු ධාතු ප්‍රත්‍යය සමවායයෙන් සිදුවූ අර්ථවත්වූ ශබ්ද රූපයකි. එය විභක්ති ශත්තාතුරූ කාරකාර්ථයක් ප්‍රකාශ නොවේ. **පාතිපදික** යනුද **නාම** යනුද ලිඞ්ගයටම නම් වෙති.

36 භාවය:- යා-සා යනු සත්‍රී ලිඞ්ගය සි. යො සො යනු පුල්ලිඟුසි. යං-තං යනු නපුංසක ලිඟුසි. මෙසේ ලිඞ්ග භෙදය ත්‍රිවිධ වේ.

37 භාවය:- ආවත්‍ථිකාය, ලිඞ්ගිකාය, නෙමිත්තිකාය, අධිච්ච සමුප්පන්නාය සි ලිඞ්ග සතරෙකි.

| ලිඞ්ග | උදාහරණ |
|---|---|
| 1 ආවත්‍ථිකලිඞ්ගය | **වච්ඡො.** |
| 2 ලිඞ්ගික ,, | **දණ්ඩී.** |
| 3 නෙමිත්තික ,, | **තෙවිජ්ජො.** |
| 4 අධිච්ච සමුප්පන්න ,, | **සිරිවඩ්ඪනකො.** |

38 භාවය:- නැවතද, ක්‍රියා නිමිත්තකාය, ජාතිනිමිත්තකාය, ගුණ නිමිත්තකාය, යාදිච්ඡක ය සි **ලිඞ්ගය** චතුර්විධ වේ. පාචකො-අස්සො-තෙවිජ්ජො-තිස්සො යනු උදාහරණයි.

39 භාවය:- සාමඤ්ඤ, ගුණ, කිත්තිම, ඔපපාතික ය සි නැවතද ලිඞ්ගය සතරාකාර වේ. මහාසම්මතො, තෙවිජ්ජො, තෙමියො, චන්දිමා යනු උදාහරණයි.

40 භාවය:- සුගමයි.

**වණ්ණනා**:- පුං-ස්ත්‍රී-නපුංසක යන ලිඞ්ගත්‍රයෙහි ආවත්‍ථික ලිඞ්ගික-නෙමිත්තික-අධිච්ච සමුප්පන්න යන සතරාකාර ලිඞ්ග භෙදයම ලැබීමෙන් ලිඞ්ගය දොළොස් ආකාර වේ.

41-42 **භාවය**;- සරලයි.

**වණ්ණනා**;- ආකාරාන්ත, ඉකාරාන්ත, ඊකාරා: ත; උකාරාන්ත ඌකාරාන්ත, ඔකාරාන්තය යි ස්ත්‍රීලිඞ්ගයෙහි ශබ් න්ගේ අන්ත භෙදය ෂට් ප්‍රකාරයෙකින් ලැබේ. අ-ආ-ඉ-ඊ-උ- -ඔකාරාන්ත යන වශයෙන් පුල්ලිඞ්ගයෙහි 7 ක් ලැබේ. නපුං ා ලිඞ්ගයෙහි මෙසේම 7 ක් ලැබේ. තිගතිපාන්තශබ්දයෝ ත්‍රිලිඞ්ග ාම සාධාරණ හෙයින් 7-8 යන වශයෙන් අන්තභෙදය තෝ: අයුරෙකින් ලැබෙයි. එය ආවත්‍ථිකාදි වශයෙන් ද කාල කාල් ෂදයානුභෙද යෙක් ලැබෙයි. මේ දැක්වූයේ **රූපසිද්ධි** ක්‍රමය යි.

43-44 **භාවය**:- ස්ත්‍රී ලිඞ්ගයෙහි අන්තනාම පසක්ද, පුල්ලිඞ්ග යෙහි හයක්ද, නපුංසක ලිඞ්ගයෙහි තුනක් ද යි ලැබෙන තුදුස් අන්තනාමයෝ ආවත්‍ථිකාදී භෙද චතුෂ්කයෙන් ගුණකළ විට සපනසෙක් වේය යනු **ශබ්දනීති** මතය යි.

**වණ්ණනා**:- **රූපසිද්ධි** මතය අනුව දෙයානු භෙදයෙක් ඇති නාමය **ශබ්දනීති** ක්‍රමය අනුව සලකානවිට ලැබෙනුයේ සපනසෙකි. ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගික නාම ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්ත ඌකාරාන්තය යි ස්ත්‍රීලිඞ්ගයෙහි අන්තභෙද පසක් ද, අකාරාන්ත පුල්ලිඞ්ගනාම ආකාර- ඉකාර- ඊකාර- උකාර- ඌකාරාන්ත ය යි පුල්ලිඞ්ගයෙහි අන්තභෙද සයක්ද, අකාරාන්ත නපුංසක ලිඞ්ගනාම- ඉකාරාන්ත - උකාරාන්ත ය යි නපුංසක ලිඞ්ගයෙහි අන්ත භෙද තුනෙක් ද යි ලැබෙන තුදුස් අන්තභෙද ආවත්‍ථිකාදි සතරෙන් වැඩිකිරීමෙන් සපනසක් වෙති.

45 **භාවය**:- ඇතැම් ආචාර්‍ය කෙනෙක් නපුංසක ලිඞ්ගයෙහි හා පුල්ලිඞ්ගයෙහි ලැබෙන අන්තයය ගැනීමෙන් අන්තභෙද දහහතක් දක්වා ආවත්‍ථිකාදී භෙද හතරෙන් ගුණ කිරීමෙන් අන්තයන්ගේ භෙදය අට සැට (68) ක් වන බව කීහු.

**වණ්ණනා**:- **න්‍යාසකාචාර්යවරයන්** අන්තභෙද සපනසක් ලැබෙන බව කියුවද, **න්‍යාසටීකාචාර්යයෝ** පුල්ලිඞ්ගයෙහි මෙන්ම නපුංසක ලිඞ්ගයෙහි ද අකාරාන්ත- ආකාරාන්ත- ඉකාරාන්ත-

ඊකාරාන්ත-උකාරාන්ත-ඌකාරාන්තයයි භෙද දසයක්ගෙනඅන්ත භෙද 17 දක්වා ආවපුබ්බාදි සත්‍තරෙන් ගුණ කොට අන්තභෙද අටසැටක් ලැබේ යයි පැවසූහ.

46 භාවය:- සුගමයි.

**වණ්ණනා:-** න්‍යාස මතය අනුව අන්තභෙද සපනස (56) ක් ද, න්‍යාසටීකාචාර්‍ය මතය අනුව අට සැට (68) ක් ද, රූපසිද්ධි මතය අනුව දෙයානුව (92) ක් දැයි නාමය පිළිබඳ අන්තභෙදයේ තිග මතයට බැසිය යුතු වේ.

47-48 **භාවය:-** කච්චායන සූත්‍ර වෘත්තියෙහි යෙදී තිබෙන "කිච්චං" යන පදය යම් හේතුවක් සම්බන්ධය කියවෙන සූත්‍රයෙක්හි ඒ හා සම්බන්ධ නොවූ දෙය හඟවන පිණිස යෙදූවකි.

49-50 **භාවය:-** මේ නාම භෙදය ලියූ පිනෙන් ගුණනැණින් අගනැන් පැමිණියෙක් වෙම්වා යි පැතුම් කළහ.

**සොදාහරණ නාම භෙදය නිමි.**

---

## කාරකය.

51 **භාවය:-** යමෙක් යෑම්, ඊම්, පිසීම් ආදි යම්කිසි ක්‍රියාවක් කෙරෙයි නම් හේ කාරක නමි.

**වණ්ණනා:-** ගමන පචන (-යාම්, පිසීම්) ආදි යම්කිසි ක්‍රියාවක් තමන් ප්‍රධානව යමෙක් කෙරෙයි නම් හේ **කාරක** නම් වේ. ප්‍රධාන වශයෙන් මේ කාරක නාමයෙන් උක්ත කර්තෘම ගැනේ. කර්මාදි සෙසු පස්දෙන කාරක නාමයෙන් සැලකෙණුයේ අමුඛ්‍ය වශයෙනි. **"කාරොති කිරියං නිප්පාදෙතී ති කාරකං"** යී පැරණියෝ කාරකය හැඳින් වූ හ. කරොතී ති=කාරො. කාරො එව=කාරකො. ක්‍රියාව කරන්නේ කාරක නමි.

52-53-54 **භාවය:-** යාම් පිසීම් ආදි ක්‍රියා නිෂ්පාදක භාව යෙන් ප්‍රධාන වශයෙන් ද, පුරුෂාදි ද්‍රව්‍ය එයට ආධාර වීමෙන් උපචාර වශයෙන් ද, කාරක නාමය ලබයි. මෙසේ අර්ථ වශයෙන් වූ කාරකය අර්ථයට කාරණ වීම් හේතුවෙන් ශබ්ද වශයෙනු දු කාරක වෙයි. ඒ මේ කාරකය ක්‍රියා නිපද වීම් ලක්ෂණයෙන් එක විධ වේ. නැවත එය **සබ්බක්‍රියාව්‍යාපි** (ෂට් කාරක ක්‍රියාවක් සමගම

පැතිර පවතින) **කාරකය** තම තමන්ගේ ම ක්‍රියාවන් සමග පැවතීම් භෙද පෙන්වන **විශෙෂ ක්‍රියාව්‍යාපි කාරක** ය යි දෙවැදෑරුම් වේ.

55 **භාවය:**– කර්තෘකාරකය, කර්මකාරකය, කරණ කාරකය, සම්ප්‍රදානකාරකය, අපාදානකාරකය, ආධාරකාරකය යි කාරක සයකි.

56 **භාවය:**– කර්තෘකාරකය උක්ත, · අනුක්ත වශයෙන් දෙයාකාර වේ. ප්‍රථමා විභක්තියෙහි යෙදෙනුයේ උක්ත කර්තෘ නම්. තෙවන විබතෙහි යෙදෙනුයේ අනුක්ත කර්තෘ නම් වේ.

**වර්ණනා:**– කර්තෘ කාරකයෙහි භෙදවයෙක් ලැබේ. යමකුගේ ඇණවීමක් ඇතිව හෝ නැතිව ක්‍රියාව කරනුයේ **කර්තෘ** නම්. **"යො කරොති ස කත්තා"** යි කියේ එහෙයිනි. යම් ක්‍රියාවකින් යමෙක් ප්‍රධාන වේනම් එය **උක්ත** ය යි. එසේ නොව අප්‍රධානව කියවේ නම් **අනුක්ත** යි. කර්තෘ උක්තවූ විට ප්‍රථමා විභක්තියෙන්ද, අනුක්තවූ විට තෘතීයා විභක්තියෙන් ද සිටී.

| **කර්තෘ** | **උදාහරණ** |
| --- | --- |
| උක්ත කර්තෘ | **"පුරිසො" මග්ගං ගච්ඡති** |
| අනුක්ත " | **"ගරුළෙන" හතො නාගො.** |

57 **භාවය:**– ස්වයං කර්තෘ, හෙතු කර්තෘ, කර්ම කර්තෘය යි කර්තෘ කාරකය ත්‍රිවිධ වේ.

**වර්ණනාව:**– (1) යමෙක් අනිකකු ගේ උත්සාහාදියක් නොමැතිව තමා ප්‍රධානව ක්‍රියාව කෙරේ නම් හේ **ස්වයං කර්තෘ** නම්. **"දන්තො" (කම්මං) කරොති** (2) යමෙක් ක්‍රියා නිෂ්පත්තියෙහිදී කර්තෘ හට ආධාරව ක්‍රියාව නිපදවා නම් හේ **හෙතු කර්තෘ** නම්. **"රාජා" දන්තං කම්මං කාරෙති.** (3) යමෙක් තමාම කර්ම, ක්‍රියාවයම කෙරේ ද ඒ කර්ම කර්තෘ නම්. **කුසූලො සයං එව භිජ්ජතෙ,** යනු ඔවුනට උදාහරණයි.

58 **භාවය:**– කර්මකාරකය ද උක්ත, අනුක්ත වශයෙන් දෙයාකාරවේ. ඔදනො පච්චතෙ–දන්තො කටං කරොති යනු උදාහරණයි.

59 **භාවය:**– නිබ්බත්ති කර්මය, විකෘති කර්මය, ප්‍රාප්ති කර්මය යි කර්මයෙහි භෙද තුනෙකි.

**වණ්ණනා:-** (1) පෙර නොපැවති යමක් අමුතුවෙන් නිපදවාලීම **නිබ්බත්ති කම්** නම්. **"කටං" කරොති**. යනු උදාහරණ යි. මෙහි "කටං" යන්නෙන් කලාල ගැනේ. එය ඊට උවමනා කරන උපකරණ යෙදීමෙන් අමුතුවෙන් නිපදවා ගත් දෙයකි.

(2) සවභාව වශයෙන් පවත්නා යම් වසතුවක් අන්‍යාකාරයට පෙරළීම **විකෘති කම්** නම්. **"කට්ඨං" ඣාපෙති,** යනු උදාහරණයි. මුලින් තුබූ වියලි දණ්ඩ දැවීමෙන් අන්‍ය ආකා (=චෙතස් සවභාව) ය කට පත්වීම මෙහි විකෘතිය යි.

(3) පෙර පැවති යමක් වෙනසකට නො පැමිණ ඇස් හමුවට පත්වීම **ප්‍රාප්ති** නම්. **"රූපං" පස්සති**. යනු උදාහරණයි.

60 **භාවය:-** නිබ්බත්ති කම්ය. සන්තජනන, අසන්ත ජනන යයි දෙපරිදි වේ. මාතා පුත්තං විජායති. පුඤ්ඤං සුඛං "ජනෙති" යනු නිදර්ශිතයි.

**වණ්ණනා:-** ත්‍රිවිධ කම්හෙදගත නිබ්බත්ති කම්යෙහිද් හෙද දෙකක් බව මින් ප්‍රකාශිතය. විද්‍යමාන වසතුවකගේ ඉපැදීම **සන්තජනන නිබ්බත්ති** කම්යයි ද, අවිද්‍යමාන වසතුවකගේ නිෂ්පාදනය **අසන්ත ජනන යයි ද** දත යුතුයි.

61 **භාවය:-** විකායත්‍ය ක..ය. පරිවත්තකාරණය, අපරිවත්තන කාරණ යයි දෙපරිදි වේ. **කට්ඨං "අඞ්ගාරං" කරොති**-සුවණ්ණං **"කටකං" කරෙ.** යනු ක්‍රමයෙන් නිදසුන් වේ

**වණ්ණනා:-** (1) යමක මුලින් පැවති සවභාවය වෙනස්ම ආකාරයකට පමුණුවා නම් ඒ කම්ය **පරිවත්තන කාරණයි. "කට්ඨං අඞ්ගාරං කරොති."** යමක් අඟුරු බවට පත්වීමෙන් මුලින් තිබුණ තත්‍වය වෙනස්ම අනකට පත්කරවන නිසා එහි පවත්නා විකෘතිය පරිවත්තන කාරණය වශයෙන් සැලකීම මනාවේ.

(2) මුලින් පැවති සවභාවයාගේ සවල්පවෙනසක් ඇති කරන විකායත්‍ය කම්ය **අපරිවත්තන කාරණ** නම් වේ. **"සුවණ්ණං කටකං කරෙ"** = රතින් කටකා භරණයක් කෙරෙයි. යන මෙහි ආභරණය තැනීමෙන් සවණ්යාගේ පැහැය නොවෙන් වූ නිසා මෙහි පැවති විකායත්‍ය අපරිවත්තන කාරණ යයි.

62 **භාවය**:– ප්‍රාප්‍ය කර්මය. කායසම්පත්ති කර්මය, චිත්ත සම්පත්ති කර්ම යයි දෙපරිදි වේ. **බුද්ධං වන්දති, ආදිච්චං නමස්සති.** යනු උදාහරණයි.

**වර්ණනා**:– පෙර පැවති යමක් ඇස් හමුවට පත්වීමෙන් ළඟට පැමිණ කාය වෙහෙසවා යම් ක්‍රියාවක් කළ යුතු නම් එය **කාය සම්පත්ති නම් ප්‍රාප්‍ය කර්මයයි. "බුද්ධං වන්දති."** බුදුන් වැඳීම ළඟට පැමිණ කළ යුතු නිසා එහි කාය සම්පත්තිය තිබේ. එසේම යමක් ඇස් හමුවට පත්වීමෙන් කාය වෙහෙසීමක් නොමැතිව සිතීම් මාත්‍රයකින් යමක් කළ යුතු නම් එය **චිත්ත සම්පත්ති ප්‍රාප්‍ය කර්මය** නම් වේ. **"ආදිච්චං" නමස්සති.** ඉරුට වඳියි. ඒ වැඳීම ළඟට නොපැමිණ කාය නොවෙහෙසා සිතෙන් පමණක් කැරෙණ නිසා මෙහි පවත්නා කර්මය චිත්ත සම්පත්ති කර්මයි.

63 **භාවය**:– ඉච්ඡිත, අනිච්ඡිත, ඉච්ඡිතානිච්ඡිත යයි කර්මභෙද තුනෙකි. භත්තං භුඤ්ජති – විසං ගිලති – ගාමං ගච්ඡං සාලං උපාගමි. යනු නිදර්ශනයි.

**වර්ණන** :– (1) ක්‍රියාව කරන්නා යමක් සතුටින්ම කෙරේ නම් එය **ඉච්ඡිත කර්ම** නමි. **"භත්තං" භුඤ්ජති.** යමෙක් බත් කයි නම් හේ එය කරනුයේ සතුටිනි. එහි පවත්නා කර්මය ඉච්ඡිත කර්මයි.

(2) යම් ක්‍රියාවක් අසතුටින්ම කෙරේනම් එය **අනිච්ඡිත කර්ම** නමි. **"විසං" ගිලති.** විස කයි. වස කෑම කරනුයේ කෙනකු සතුටින් නොවේ. යම් කිසි කොපයක් පැමිණීවිට එය කරනත් කට ළඟට පවා ගන්නේ ඉතා අමාරුවෙනි. එ නිසා මෙහි පවත්නා කර්මය **අනිච්ඡිත කර්මයයි.**

(3) කැමැත්තක් ඇතිව හෝ නැතිව යමක් කෙරේ නම් එය **ඉච්ඡිතා නිච්ඡිත කර්මයයි. ගාමං ගච්ඡං සාලමුපාගමි.** මෙහි ගමට යන්නා අතර මගදී සල් ගහක් ළඟට පැමිණීම ඔහු බලාපොරොත්තුවෙන් කළ දෙයක් නොවේ. ඒ නිසා මෙහි පවත්නා කර්මය ඉච්ඡිතා නිච්ඡිත කර්මයයි.

**බුද්ධප්පියාචාර්යවරයෝ** ඉච්ඡිත, අනිච්ඡිත, ඉච්ඡිතානිච්ඡිත, අකථිත යයි කර්මභෙද හතරක් දක්වති.

64 **භාවය**:- කරණ කාරකය. බාහිර කාරණය, අජ්ඣත්තික කාරණ ය යි දෙපරිදි වේ. දාත්තෙන වීහිං ලුනාති, චක්ඛුනා චන්දං ඉක්ඛතෙ. යනු නිදර්ශනයි.

**වර්ණනා**:- ෂට්විධ කාරකයන් අතුරෙහි වූ කරණය දෙපරිදි වේ. ක්‍රියාවක් නිපදවීමේ දී කර්තෘට අතිශයෝපකාර වත්ව සිටිනුයේ කාරණ ය යි. ඒ කරණ කාරකය බාහිර කරණය, අජ්ඣත්තික කාරණ ය යි දෙපරිදි වේ.

**බාහිර කරණ කාරකය = "දාත්තෙන" වීහිං ලුනාති**
**අජ්ඣත්තික කරණ කාරකය = "චක්ඛුනා" චන්දං ඉක්ඛතෙ.**

65–66 **භාවය**:- සුගමයි.

**වර්ණනා**:- චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, මන යන අධ්‍යාත්මික ෂඩින්ද්‍රියන්ගේ වශයෙන් අධ්‍යාත්මික කරණය සවැදෑරුම් බව මින් දැක්වූ හ.

1 **"චක්ඛුනා" රූපං පස්සති.**
2 **"සොතෙන" සද්දං සුණාති.**
3 **"ඝාණෙන" ගන්ධං ඝායති.**
4 **"ජිව්හාය" රසං සායති.**
5 **"කායෙන" ඵොට්ඨබ්බං ඵුසෙ.**
6 **"මනසා" ධම්මං ජානාති.**

57 **භාවය**:- කායපුබ්බක සම්ප්‍රදාන කාරකය, චිත්තපුබ්බක සම්ප්‍රදාන කාරකය යි සම්ප්‍රදාන කාරකයෙහි භෙදවයෙකි.

**වර්ණනා**:- සම්ප්‍රදාන නම් මනාකොට දීමයි. පූජාබුද්ධියෙන් හෝ අනුග්‍රහබුද්ධියෙන් යමකුට යමක් දේ නම් ඒ දීම ලබන්නේ **සම්ප්‍රදාන** නම්. යම් දාන වස්තුවක් කයින් පිළිගන්නේ ද? එය **කායපුබ්බක සම්ප්‍රදානය** යි **"භික්ඛුස්සං" චීවරං දෙති.** යනු එයට උදාහරණයි. යම් දාන වස්තුවක් සිතින් පිළිගනී ද? ඒ **චිත්තපුබ්බක සම්ප්‍රදානය** යි. **"නාරායනස්ස" බලිං දෙති.** යනු නිදර්ශනයි. සම්ප්‍රදාන කාරකයට නියමිත විබත සතරවන විබතයි.

68 **භාවය**:- අනිරාකරණ සම්ප්‍රදානය, ආරාධන සම්ප්‍රදානය, අබ්භනුඤ්ඤ සම්ප්‍රදානය යි සම්ප්‍රදාන කාරකය ත්‍රිවිධ වේ.

**වණ්නා**:– (1) දාන ක්‍රියාව නොවලක් වන්නා **අනිරාකරණ** සම්ප්‍රදාන නමි. **"රුක්ඛස්ස" ජලං දදාති.** යනු උදාහරණයි. (2) දාන ක්‍රියාවට අවසර දෙන්නේ **අබ්භනුඤ්ඤ** සම්ප්‍රදානයි. **"භික්ඛුස්ස" චීවරං දදාති.** යනු නිදර්ශනයි. (3) ඉල්වා දානය ලබන්නා **ආරාධන** සම්ප්‍රදාන නමි. **"යාචකස්ස" භොජනං දදාති.** යනු දෘෂ්ටාන්ත යි.

69 **භාවය**:– අපාදාන කාරකය. කායපුබ්බක අපාදානය, චිත්ත පුබ්බක අපාදානය යි දෙපරිදි වේ. මුනයො "ගාමා" අපෙනති– "පාපා" චිත්තං නිවාරයෙ. යනු නිදසුනි.

70 **භාවය**;– චල, අචල වශයෙන් අපාදාන කාරකය දෙපරිදි වේ. "හත්ථික්ඛන්ධතො" ඔරුයහ–"රුක්ඛතො" පණ්ණා පතන්ති. යනු නිදසුනි.

71–72 **භාවය**:– උද්දිඨ විසය, උපාත්ත විසය, අනුමෙය විසය, ය යි අපාදානය ත්‍රිවිධ වේ. (1) ගාමාමුනයො අපෙනති. (2) කුසූලා තණ්ඩුලං පචෙ. (3) ඉමෙමාධුරා අභිරූපතරා පාටලිපුත්තකෙහි. යනු උදාහරණයි.

**වණ්නා**:– පහවීම් ආදී යම් ක්‍රියාවට සීමාවූ වස්තුව අපාදාන ය යි දතයුතු. මෙහි පංචමී විභක්තිය වේ. යමක අපාදාන විෂය වූ ක්‍රියාව ව්‍යක්ත වශයෙන් දක්නා ලැබේ ද **එය උද්දිෂ්ට විෂය** අපාදානය නමි. **"ගාමා" මුනයො අපෙනති**:– ගමෙන් මුනීහු පහවෙති. මෙහි මුනීන්ගේ පහවීම් ක්‍රියාව ශමින් ම බව ප්‍රකටව පවත්නා නිසා "**ගාමා**" යනු **උද්දිෂ්ටවිෂය** අපාදානයෙන් පොෂිතය. අපාදාන විෂය වූ ක්‍රියාව පිටතින් ගෙන දතයුතු වේ නම් එහි පවත්නා අපාදානය **උපාත්ත විෂය වේ. "කුසූලා" තණ්ඩුලං පචෙ.** යන මෙහි **"නීහරිත්වා"** යී ක්‍රියාව පිටතින් ගෙන කියයුතු නිසා උපාත්ත විෂය අපාදානයෙන් යුක්තවී තිබේ.

පිටතින් යමක් ගැනීමෙන් හෝ නොගැනීමෙන් අනුමාන වශයෙන් යම්කිසි නිගමනයකට පත්වීමෙක් වේ නම් ඒ අනුමෙය විෂය අපාදාන නම් වේ. **මාධුරා "පාටලි පුත්තකෙහි" අභිරූප තරා.** මධුරාපුර වැසියෝ පැලලුප් නුවර වැසියන්ට වඩා රූමත්ය යන මෙය යම්කිසිවක් නිසා අනුමාන වශයෙන් බැසගත් තීරණ යෙකි. **ඒ නිසා එහි අනුමෙය** විෂය අපාදානය ගැබ්ව පවති.

73 **භාවය:**– බ්‍යාපිකාධාරය, ඖපශ්ලෙෂිකාධාරය, වෛෂයිකාධාරය, සාමීපිකාධාරය ය යි ආධාර කාරකය සතර වැදෑරුම් වේ.

**වණ්ණනා:**– කර්තෘ කර්ම දෙදෙනා ක්‍රියාවන්ට ආධාර වෙත්. ක්‍රියාවට ආධාර වූ කර්තෘ කර්මයන් දරා සිටින්නේ ආධාර කාරකය යි. **"කර්තෘ කර්මධාරා කතනිෂ්ට ක්‍රියයා ආධාරඃ, කාරකමධිකරණං* ස්‍යාත්"** යි සකුවියරණැදුරන් කීයේ ද එයම ය. ඕකාස කාරක යනුද මෙයට ම නමෙකි. එසේ වූ ආධාර කාරකය මාගධ වෛයාකරණයෝ කොට්ස් සතරකට බෙදා දක්වූ හ. සංස්කෘත ශාබ්දිකයෝ සය වැදෑරුම් කොට කීහ.

(1) **බ්‍යාපිකාධාරය:**– යම් ආධාරයක් ආධෙය වස්තුව විසින් හාත්පසින් ම පැතිරගන්නා ලද්දේ නම් ඒ ආධාරය බ්‍යාපිකාධාරය නම්වේ. **"තිලෙසු" තෙලං අත්‍ථි.** යනු උදාහරණයි.

(2) **ඖපශ්ලෙෂිකාධාරය:**– යම් ආධාර වස්තුවක් ආධාරය ලබන (ආධෙය) වස්තුව හා අතරක් නැතිව ගැටී පවතී නම් ඒ ඖපශ්ලෙෂිකාධාරය නමි. **"ඝටෙසු" උදකං අත්‍ථි.** යනු නිදර්ශනයි.

(3) **වෛෂයිකාධාරය:**– ආධාරය ලබන වස්තුව අන්තැනක නොවී නිත්‍යයෙන් ම යම් ආධාරයෙක්හි පවතීනම් ඒ විෂයාධාර නම් වේ. **"සලිලෙ" මච්ඡා හොන්ති** යනු දෘෂ්ටාන්තයි.

(4) **සාමීපිකාධාරය:**– යම් ආධාරයක් ආධෙය වස්තුවට පිහිට වීමෙන් එයින් සමීපවූ දෙයක් ගතයුතුවේ නම් එය සාමීපිකාධාරය නම්වේ. **සස්සං "නදියං"** – ගඟේ ගොයම් යන මෙහි ගඟෙහි නොව ගඟ ළඟවූ භූමියෙහි ගොයම් ය යි ගතයුතු නිසා මෙහි පවත්නා ආධාරය සාමීපිකාධාරය වේ.

74 **භාවය:**– ව්‍යාපිකාධාරය– සකලබ්‍යාපික, එකදෙසබ්‍යාපිකය යි විවිධ වේ. තිලෙසු තෙලං තිඨති; ජලෙසු ඛීරං තිඨති. යනු උදාහරණයි.

---

* "කර්තෘ කර්ම ව්‍යවහිතා මසාක්ෂාත් ධාරයත් ක්‍රියාම්,
උපකුර්විත් ක්‍රියා සිද්ධෞ ශාස්ත්‍රෙ'**ධි කරණං** සමෘතම්."

75 **භාවය:**– ඖපශ්ලේෂිකාධාරය– අලලී යන ඖපශ්ලේෂිකය, අනලලී යන ඖපශ්ලේෂික ය යි දෙකකි. උක්ඛලියං ආචාමො පරියඩෙක තිඪති යනු උදාහරණයි.

76 **භාවය:**– වෛසයිකාධාරය–දේශාන්තරාවච්ඡේදය, අභ්‍යන්තර භාවය යි දෙවැදෑරුම් වේ. පාදෙසු පතිත්වාරොදි, නභෙ සකුණා පක්ඛන්දි. යනු දෘෂ්ටාන්තයි.

77 **භාවය:**– සමීපයාගේ ද, සමීපස්ථ වස්තුහුගේ ද නාමය උපචාර වශයෙන් ලැබුයේ සාමීපිකාධාර නම් වේ. ගඞ්ගායං ඝොසං යන මෙහි ඉවුර කරණකොට ගෙන උපචාර වශයෙන් ගත සමීපිකාධාරත්වය ලැබී.

78 **භාවය:**– මුඛ්‍ය, පරම්පරා, තදාශ්‍රය, තදුපනිශ්‍රය වශයෙන් ද ආධාරයෙහි භෙද සතරෙක් වේ. බ්‍රහ්මගිහි ඔභාසො තිඪති–පරියඩෙක රාජා තිඪති–රූපෙසඤ්ඤා–සාසනෙ වසති භික්ඛු යනු උදාහරණයි.

79 **භාවය:**– අකාරක සයෙකි. සම්බන්ධය–ආලපනය–නිර්ධාරණය–ලක්ෂණය–හෙතුවය–අව්‍යන්තන සංයොගය යන මොහුයි.

**වර්ණනා:**– සාමි, ආලපන යන මොහු කාරකත්වයෙන් බැහැර විය. ඔව්හු ක්‍රියාර්ථයක් ඉපදීමෙහි අසමර්ථ හෙයිනි. එහෙයින් ම එය අකාරක නාමයෙන් ශාබ්දිකයෝ සැලකූහ. යමකුගේ අයිතියක් ප්‍රකාශ කරනුයේ **සම්බන්ධය** යි. අනභිමුඛ වූවකු අභිමුඛ කිරීම **ආලපන** නම්. මොහු විභක්ති වශයෙන් ද, නිර්ධාරණ, හෙතු, ලක්ඛණ, අව්‍යන්තන සංයොග යන මොහු අර්ථවශයෙන්ද, ක්‍රියාර්ථයක් ඉපදීමෙහි අසමර්ථ හෙයින් කාරකත්වයෙන් බැහැරවූ බව සැලකිය යුතු.

80 **භාවය:**– සුගමයි.

81 **භාවය:**– ජනකාදීන් ගේ වශයෙන් සම්බන්ධයෙහි භෙද විවිධ වෙති.

**වර්ණනා:**– ක්‍රියා නිෂ්පත්තියෙන් වෙන් වෙන්ව පැවති වස්තූන් ගේ බැඳීම ඇතිවීම සම්බන්ධය යි. ඒ සබඳ විබතෙහි භෙද බොහෝ වෙති.

| | | | | |
|---|---|---|---|---|
| 1 | ජඤ්ඤජනක | සම්බන්ධය | = | රඤ්ඤො පුත්තො. |
| 2 | වාච්ච වාචක | ,, | = | සද්දස්සත්ථො. |
| 3 | විකාර විකාරි | ,, | = | ඛීරස්සදධි. |
| 4 | පරිමාන පරිමෙය්‍ය | ,, | = | තිලානං මුට්ඨි. |
| 5 | පූරණ පූරිතබ්බ | ,, | = | වස්සානං තතියෙ මාසෙ. |
| 6 | කාරණ කාරක | ,, | = | කම්මානං ඵලං. |
| 7 | සෙව්‍ය සෙවක | ,, | = | මහොසධස්ස සුවො. |
| 8 | පූජ්‍ය පූජක | ,, | = | බුද්ධස්ස සාවකො. |
| 9 | බොධ්‍ය බොධක | ,, | = | ධම්මස්ස විඤ්ඤාතාරො. |

යනාදි වශයෙන් භෙද දතයුතු වේ.

82 **භාවය:**– සුගමයි.

**වණ්ණනා:**– සවිඤ්ඤාණක ආලපනය, අවිඤ්ඤාණක ආලපනය යි. ආලපන දෙකකි. “**භොති ඉත්ථි**” යන මෙහි ස්ත්‍රිය සවිඤ්ඤාණක තැනැත්තියකි. ඒ නිසා එහි පවත්නා ආලපනය **සවිඤ්ඤාණක ආලපනය** යි. “**භො සෙලො**” යන මෙහි සෙල (ගල) අවිඤ්ඤාණක වස්තුවෙකි. ඒ නිසා ඒ ආලපනය **අවිඤ්ඤාණක ආලපනය** යි.

83–84 **භාවය:**– සුගමයි.

**වණ්ණනා:**– නිර්ධාරණ භෙද සතරකි. ජාතිය–ගුණය–ක්‍රියාය නාමය යන වශයෙනි. “**මනුස්සානං**” **ඛත්තියො සෙට්ඨො.** මෙහි මිනිසුන්ගෙන් ක්ෂත්‍රියයා වෙනස් කෙළේ **ජාතිනිර්ධාරණ**යෙනි. **සාමා** “**නාරීසු**” **දස්සනී**=යන මෙහි ගැහැණුන්ගෙන් සාමාව වෙනස් කෙළේ **ගුණනිර්ධාරණ**යෙනි. “**පථිකෙසු**” **ධාවන්තො සීඝතමො.** මෙහි යන්නවුන් ගෙන් දුවන්නා වෙනස් කෙළේ **ක්‍රියා නිර්ධාරණ** යෙනි. “**සාවකෙසු**” **ආනන්දො බහුස්සුතො.** මෙහි ශ්‍රාවකයන් අතුරෙන් ආනන්ද තෙරුන් වෙනස් කෙළේ **නාම නිර්ධාරණ** වශයෙනි.

85 **භාවය:**– ලක්ෂණය, හෙතුය, අව්‍යතනය යන මොහු ක්‍රියා නො නිපදවන හෙයින්ද ක්‍රියා සම්බන්ධය නො ලබන හෙයින් ද කාරකත්වයෙන් බැහැර වූහ.

86–87 **භාවය:**– භාවය, භවවනතය, ලක්ෂ්‍යය, ලක්ෂ්‍යවනත ය යි ලක්ෂණ භෙද සතරකි. **ගොසු දුය්හමානෙසු පුරිසො ගතො.**

**දුඬෙසු ආගතො.** යනු උදාහරණයි. භාවලක්ෂණ ක්‍රියාවන්ගේ කර්තෘද කර්මයද යන දෙක තබබනන ලක්ෂ්‍යවනන නම් වේ.

**වණ්ණනා;-** මුලින් යෙදෙන ක්‍රියාව ලක්ෂණ ක්‍රියායි. අනන යෙහි යෙදෙන ක්‍රියාව ලක්ෂ්‍යවනන ක්‍රියායි. **ගොසු දුයහ මානෙසු පුරිසො ගතො** = යන මෙහි **"ගොසු"** යනු දෙවීම් ක්‍රියාවෙහි කර්මයයි. **"දුයහමානෙසු"** යනු **භාව** යයි (පූර්වපිති ක්‍රියායි) **"පුරිසො"** යනු යාම් ක්‍රියාවෙහි කර්තෘයි. ගතොයනු ලක්ෂයි. (අපර ක්‍රියායි) **"ගො"** යනු **භාවවනන** ය යි. **"පුරිස"** යනු **ලක්ෂ්‍ය වනන** ය යි.

88–89 **භාවය:-** හෙතු **හෙද** තුනෙකි. ජනක හෙතුය සම්පාපක හෙතුය, ඤාපක හෙතුය යන මොහුයි. මොවුන'තර වූ ඤාපක හෙතුව. සවභා හෙතුය, ව්‍යතිරෙක හෙතුය, කාර්‍ය හෙතු යයි කොටස් තුනකට බෙදේ. බීජාය අඞකුරො ජාතො, තීරං නාවාය පාපුණි යනු උදාහරණ යි. උණ්හත්තා අග්ගි අත්ථි-සීතත්තා අග්ගි අත්ථි-ධූමාය අග්ගි අත්ථි යනු ඤාපක හෙතුනට උදාහරණ යි.

90 **භාවය:-** කාල අත්‍යනත සංයොගය, අධ්‍වා අත්‍යනත සංයොග යයි අත්‍යනත සංයොගයේ හෙද දෙකෙකි. මාසං සජ්ඣායති, යොජනඩානං සජ්ඣා යති. යනු උදාහරණයි.

**වණ්ණනා:-** ද්‍රව්‍ය ගුණ ක්‍රියාවන් සමග කාල මාර්ග දෙදෙනාගේ අතර නොමැති සම්බන්ධයක් ඇතිවීම **අත්‍යනත සංයොග** නම් වේ. **මාසං සජ්ඣායති**=මසක් මුලුල්ලෙහි හදාරයි. යන මෙහි **"සජ්ඣායති"** යන ක්‍රියාව සමග **"මාසං"** යන කාලවාචී පදයාගේ අතර නො මැති සම්බන්ධය ලබා තිබෙන නිසා මෙය කාල අත්‍යනත සංයොග යෙන් යුකතවී තිබේ. **යොජනඩානං සජ්ඣායති**=යොදුනක් පමණ මාර්ගයෙහි හදාරයි. යන මෙහි ක්‍රියාව සමග **"යොජන"** යන පදයා නිරනතර සංයොගය ලබා තිබෙන නිසා මෙය මාර්ග අත්‍යනත සංයොගයෙන් යුකතවී තිබේ.

91–92–93–94–95 **භාවය:-** විශෙෂණය, තුල්‍යාධිකරණ විශෙෂණය, භින්නාධිකරණ විශෙෂණ යයි දෙපරිදි වේ. "තිලොක මහිතො නාථො.=ශොභනෙනත ගොතමෙ භවෙ." යනු උදාහරණයි. යම් විශෙෂණයක් විශෙෂ්‍යයෙහි පවත්නා ලිඞග විභක්ති වචන ආදිය ගනී නම් ඒ තුල්‍යාධිකරණ විශෙෂණය නම් වේ. එහි ආස

යාසයිහාව තුල්‍යාධි කරණ විශෙෂණය=තද්භාවණ තද්විශෙෂ්‍ය ගුණෛකතා–ධර්මෛකතා–ඵලෛකතා තුල්‍යාධි කරණ යයි භෙද සයෙක් ලැබේ.

රත්තො, පටො, සුවො, සෙතො–සාරී, හත්ථි, බුද්ධො, ජිනො නීලො, වණ්ණො, අම්බො, පානො–සීහො, නරො, අතිලො අස්සො–අම්බිලො, ගරුකො, කටුකො, රසො–ගද්‍රහතං සුසං යුත්තං ඔසධං–දුයුත්තං ඔසධං විසං, යනු උදාහරණ යි.

**වණ්ණනා:**– ජාති, ගුණ, ක්‍රියා, ද්‍රව්‍ය, නාම යන මොවුන් ගේ වෙන් වෙන්ව පැවැත්ම නිමිතිකොට ඇති ශබ්ද විශෙෂණ විශෙෂ්‍ය භාවයෙන් එක අර්ථයක පැවැත්ම තුල්‍යාධි කරණ නම්වේ. "**භින්නප්පවත්ති නිමිත්තානං සද්දානං එකස්මිං වත්ථුනිපවත්තනං තුල්‍යාධි කරණං**" යි ධර්මකීර්තිමාහිමියෝ මෙයම පැවසූහ.

96–97 **භාවය:**– තෘතීයා භින්නා කරණය–ෂෂ්ඨී භින්නාධි කරණය සප්තමී භින්නාධි කරණ ය යි භින්නාධි කරණ විශෙෂණයේ භෙද තුනක් ලැබේ. ගොත්තෙන ගොතමොනාථො රඤ්ඤොව පුරිසොහොති. බ්‍රාහ්මණො ගෙහෙ එව තිසිතෙනා යනු උදාහරණ යි.

**වණ්ණනා:**– විශෙෂ්‍ය පදයෙහි ඇති ලිඞ්ග විභක්ති ආදිය විශෙෂණ පදයෙහි නැත්නම් ඒ **භින්නාධි කරණ විශෙෂණ** නම් වේ. එය තෘතීය–ෂෂ්ඨී–සප්තමීන්ගේ වශයෙන් ත්‍රිවිධ වේ. "**ගොතමො**"යි විශෙෂ්‍ය පදය ප්‍රථමා විභක්තියද, විශෙෂණ පදය "**ගොත්තෙන**"යි තෘතීයා විභක්තියද ගත්තිසා මේ තෘතීයා භින්නාධි කරණයෙන් යුක්ත වී තිබේ. **රඤ්ඤො පුරිසො–බ්‍රාහ්මණො–ගෙහෙ** යන මේ උදාහරණයන්හි විශෙෂණ පද "**රඤ්ඤො–ගෙහෙ**" යි. ෂෂ්ඨී, සප්තමී විභක්තිද, විශෙෂ්‍ය පද "**පුරිසො–බ්‍රාහ්මණො**" යි ප්‍රථමා විභක්තිද ගත්තිසා මොවුන් ෂෂ්ඨී හා සප්තමී භින්නාධි කරණයෙන් යුක්ත වී තිබේ.

98 **භාවය:**– සුගමයි (කර්තෘගේ ආශංසනය)

**සොදාහරණ කාරක කාරක භෙදය නිමි.**

## සමාස භෙද.

99 භාවය:– නානාර්ථවත් නාමයෝ ඒකාර්ථවත් බවට පමුණු වනු ලැබෙත් නම් ඒ සමාස ය වේ. ස්‍යාද්‍යන්ත නාමයන්ගේ කොට කිරීම හෝ, සමාසය වේ. මෙසේ සංක්‍ෂෙප කිරීම් වශයෙන් ඒකවිධ වේ.

වණ්ණනා:– සමසනං=සමාසො, සං පූර්ව අසු=ඛෙපෙ. යන දසින් නිපන් මෙසින් පඤ්චවිධ නාමයන්ගේ සංක්‍ෂෙප කිරීම ප්‍රකාශ කෙරේ. එනම් වෙන් වෙන්වූ අර්ථ ඇති නාම පද එකතුව ඒකාර්ථයක් ප්‍රකාශ කිරීම වේ. ඒකවිභක්තික භාවය, ඒකොච්චාරණය, ඒක පද භාවය සමාසයේ ප්‍රයෝජන වේ.

100 භාවය:– නිච්ච සමාසය–අනිච්ච සමාස ය යි සමාසය දෙවැදෑරුම් වේ. අරිඥමො–දීපඞ්කරෝ යනු නිදසුනි.

වණ්ණනා:– යථොක්තාකාර වූ සමාසය කොටස් දෙකකට බෙදේ. එනම් නිත්‍ය සමාසය, අනිත්‍ය සමාසය කියා යි. යම් පදයක් වාක්‍යයෙහි ද, සමාසයෙහි ද, එක ස්වරූපයකින්ම සිටී නම් ඒ නිත්‍ය සමාසය යි. **දීපඞ්කරෝ** යන සංඥා ශබ්දය හැම තැන මෙසේම පවත්නා බැවින් ඒ **නිත්‍ය** සමාසයි. එයින් අන්‍යවූ මුනින්‍ද්‍රාදි ශබ්ද **අනිත්‍ය සමාස** නම්වේ. විග්‍රහ ඇත්තේ අනිත්‍ය සමාසය යි ද, විග්‍රහ නැත්තේ නිත්‍ය සමාසය යි ද සමහරු කියති.

101 භාවය:– ලුප්ත, අලුප්ත වශයෙන් නැවත සමාසය දෙ පරිදි වේ. මුනිඥ–ගවම්පති යනු නිදසුනි.

වණ්ණනා:– සමාසවන පදයන්ගේ විභක්ති ලොපය වීමෙන් යම් සමාසයක් වේ නම් හේ ලොප් සමාස නමි. "මුනිඥ" යනාදි ය යි. විභක්ති ලොප් නොවී ඒකාර්ථවත් වූ සමාසය අලොප සමාස නමි. "**ගවම්පති**" යනාදිය යි.

102 භාවය:– නැවත යුක්තාර්ථ සමාස, අයුක්තාර්ථ සමාසය යි සමාසය දෙපරිදි වේ. මුනිඥ–අස්සඩ භොජන යනු උදාහරණයි.

වණ්ණනා:– සමස්‍ය මාන පදයන්ගේ ඇති අන්‍යොන්‍ය සම්බන්ධාර්ථය **යුක්තාර්ථ** නමි. එයින් අන්‍යවූයේ **අයුක්තාර්ථ** නමි. යුක්තාර්ථ නාමයන් ගේ කොට කිරීම සමාසය යි ප්‍රධාන වශයෙන් කීවද් ඇතැම් තැන අයුක්තාර්ථවත් නාමයන් ගේ ද සමාසය වන බවට "**අපුත්තකෙයයා**" යනාදිය උදාහරණයි.

103 භාවය:– ශබ්ද සමාසය. අර්ථ සමාසය. ශබ්දාර්ථ සමාසය යි සමාසය ත්‍රිවිධ වේ.

වණ්ණනා;– (1) යම් සමාස පදයෙක් හි පද සංක්ෂෙපය විනා යුක්තාර්ථ බවක් නොවේ ද? ඒ ශබ්ද සමාස නම්. අස්සධභොජී යනු උදාහරණයි.

(2) යම් සමාස පදයෙක් අර්ථයෙන් මිස විභක්ති ලොපයෙන් සංක්ෂෙප කිරීමක් නොවේ ද ඒ අර්ථ සමාස නම්. උරසිලොමො යනු උදාහරණයි.

(3) යම් පදයෙක යථොක්ත ලක්ෂණවයම වීනම් ඒ ශබ්දාර්ථ සමාස නම්. නීලුප්පලං යනු උදාහරණයි.

104 භාවය:– ආදිපද ලොප, මධ්‍යපද ලොප, අන්තපද ලොප යන මොවුන් ගේ වශයෙන් සමාසය ත්‍රිවිධ වේ. "දත්තො අස්සරථො–රූපං" යනු උදාහරණයි.

වණ්ණනා:– දෙවෙන දත්තො=දෙවදත්තො යී විය යුතු තැන ආදියෙහි වූ "දෙව" ශබ්ද ලොපයෙන් දත්තො යී ද, අස්සෙන යුත්තො රථො=අස්ස යුත්ත රථො යී විය යුතු තැන මධ්‍යයෙහි වූ "යුත්ත" යනු ලොපයෙන් "අස්සරථො" යී ද රූපසඤ්ඤා=රූපසඤ්ඤා යී විය යුත්තෙහි අන්තයෙහි වූ "සඤ්ඤා" යනු ලොප්ව "රූපං" යී ද විය.

105 භාවය:– පූර්ව පදාර්ථ ප්‍රධානය–උත්තර පදාර්ථ ප්‍රධානය– උභය පදාර්ථ ප්‍රධානය–අන්‍ය පදාර්ථ ප්‍රධානය යී අර්ථ ප්‍රධාන වශයෙන් සමාසය සතරාකාර වේ. තිලොකං–රාජපුත්තො–අජෙළකං–ගොධනො, යනු ක්‍රමයෙන් උදාහරණයි.

වණ්ණනා:– (1) ද්විගු, අව්‍යයීභාව යන සමාස පූර්ව පදාර්ථ ප්‍රධානය. තිලොකං උපනගරං. යනු උදාහරණයි. (2) කම්මධාරය, තප්පුරිස යන සමාස උත්තර පදාර්ථ ප්‍රධානය. මහාරාජා, රාජපුත්තො. යනු උදාහරණයි. (3) ද්වන්ද්ව සමාසය උභය පදාර්ථ ප්‍රධානය. අජෙළකං යනු උදාහරණයි. (4) අන්‍ය පදාර්ථ වූයේ බහුබ්බීහි සමාසය යි. ගොධනො යනු උදාහරණයි.

106–107 භාවය:– අව්‍යයීභාව, ද්විගු, ද්වන්ද්ව, කම්මධාරය, තප්පුරිස, බහුබ්බීහි ය යි සමාසය ෂට්ප්‍රකාරයි. යථාරූපි–තිලොකං සමණ බ්‍රාහ්මණා—නීලුප්පලං–රාජ පුත්තො—ලම්බකණ්ණො. යනු උදාහරණයි.

108 **භාවය:**– ප්‍රථමාදි විභක්තීන්ගේ ලොප භේදයෙන් අව්‍යයී භාව සමාසය සත්වැදෑරුම් වේ.

**වණ්ණනා:**– "අව්‍යය" යනු උපසර්ග නිපාතයන්ට නමෙකි. නිපාතොපසර්ගයන් පෙරටුව තත් උපසර්ග නිපාතයන්ගේ ම අර්‍ථය ප්‍රධානව යෙදෙන සමාසය **අව්‍යයී භාව සමාස** නම්. බාලාවතාර, රූපසිද්ධි ශබ්ද සාරාර්‍ථ ජාලිනී ආදියෙහි **අව්‍යයී භාව** සමාස භෙද නිපාත පූර්‍ව අව්‍යයී භාව, උපසර්ග පූර්‍ව අව්‍යයී භාවය යි භෙද දෙකක් වශයෙන් දක්වා තිබේ. මේ සමාසය නිත්‍ය සමාසයෙකි. පූර්‍ව පදාර්‍ථ ප්‍රධානය. නපුංසකලිඟු හා එක වචන ද ඇත්තේ වේ.

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රථමා විභක්තිලොප අව්‍යයී භාව සමාසය | | | = | **යථාරුචි.** |
| ද්විතීයා | ,, | ,, | = | **අධිමාතරං.** |
| තෘතීයා | ,, | ,, | = | **අධිරූපකං.** |
| චතුර්‍ථී | ,, | ,, | = | **යථාකකමං.** |
| පංචමී | ,, | ,, | = | **නිබ්බානං.** |
| ෂෂ්ඨී | ,, | ,, | = | **උපනගරං.** |
| සප්තමී | ,, | ,, | = | **අධිනවවං.** |

109 **භාවය:**– සමාහාර ද්විගුසමාසය. අසමාහාර ද්විගුසමාසය යි ද්විගු සමාසයෙහි භෙද දෙකකි.

**වණ්ණනා:**– කර්‍මධාරය සමාසයාගේ ම ප්‍රභෙදයක් වූ මේ සමාසය සමාහාර, අසමාහාර යන ද්විප්‍රභෙදයකින් සමුපලක්‍ෂිතය. සංඛ්‍යාවාචක පදයක් පූර්‍වමම උක්තව යෙදෙන සමාසය **ද්විගු** නම්. උභය පදාර්‍ථ ප්‍රධානය යි ද ඇතැම්හු කියති. (1) සමූහයක් ප්‍රධානව එක ක්‍රියාවකින් යුක්ත සමාසය **සමාහාරද්විගු** නම්. **"තිලොකං"** යනු උදාහරණයි. (2) අවයව ප්‍රධානව යෙදෙනුයේ **අසමාහාර** නම්. **"පඤ්චින්ද්‍රියානි"** යනු උදාහරණයි. සංඛ්‍යා පූර්‍වත්‍වයත්, නපුංසක ලිඟු බවත්, එකවචනත්‍වයත් මේ සමාසයෙහි ලක්‍ෂණ වෙති. මේ මෙසේ වුවද අසමාහාර ද්විගු සමාසය බහුවචනයෙහි ද වරනැගේ.

110 **භාවය:**– සමාහාර ද්වන්ද්ව සමාසය, ඉතරීතර යොග ද්වන්ද්ව සමාසය යි ද්වන්ද්ව සමාසයෙහි භෙද දෙයෙකි. අජෙලකං යනු සමාහාර ද්වන්ද්ව සමාසයට උදාහරණයි. සමණ බ්‍රාහ්මණා යනු ඉතරීතර යොග ද්වන්ද්ව සමාසයට උදාහරණයි.

**වණ්ණනා:–** සමාන විභක්තික නාමයන්ගේ පිඩු කිරීම **ඬඬ** නම්. මෙයට චකාරාථ සමාසය යි ද කියති. සමුච්චය, අන්වාචය ඉතරීතර යොග, සමාහාර ය යි **ඬඬ සමාස** භෙද සතරක් වුවද මෙහි දක්වූයේ පශ්චිම විකය ය. සමූහ සමූහව සමාස වුවද එක ක්‍රියාවක් අපෙක්‍ෂා කරනුයේ **ඉතරීතර යොග** නම්. **සමාහරය**= (109 වණ්ණනාව බලනු.) සමුච්චය, අන්වාචය දෙකෙහි සමාස වීමෙක් නොමැත. සමාහාර ඬඬ සමාසයෙහි දී එකවචන බවත්, නපුංසක ලිඟු බවත් වේ.

111 **භාවය:–** සුගමයි.

**වණ්ණනා:–** සමාන ලිඞ්ග විභක්ත්‍යාදිය ඇති පදයන්ගේ කොටි කිරීම **කම්ධාරය** නම්. විශෙෂණ විශෙෂ්‍ය දෙදෙනා දරන අර්ථයෙන් ද කම්ධාරය නම් වේය යි දත යුතුයි. මෙය පර පදාර්ථ ප්‍රධානය. මේ සමාසයෙහි භෙද නවයෙකි.

112–113 යථොක්ත නවවිධ කම්ධාරය සමාසයට උදාහරණ මෙසින් දක්වේ.

| | | | |
|---|---|---|---|
| විශෙෂණ | පූර්වපද | කම්ධාරය | **නීලුප්පලං.** |
| ,, | උත්තර පද | ,, | **ගණුත්තාමො.** |
| ,, | උභය පද | ,, | **සණ්හ සුඛුම ධම්මො.** |
| සම්භාවනා | පූර්ව පද | ,, | **හෙතුපච්චයො.** |
| උපමා | ,, | ,, | **සංඛ සෙතං.** |
| අවධාරණ | ,, | ,, | **ගුණධනං.** |
| කු නිපාත | ,, | ,, | **කු පුත්තො.** |
| න ,, | ,, | ,, | **අභාවො.** |
| ප ,, | ,, | ,, | **පාවචනං.** |

114 **භාවය:–** ප්‍රථමා තප්පුරිස, අමාදි තප්පුරිස ය යි තප්පුරිස සමාසයෙහි භෙදවයෙකි. අබ්‍රාහමණො, භූමිගතො යනු උදාහරණයි.

**වණ්ණනා:–** විතීයා විභක්ත්‍යාදීහු පරපද නාමයන් හා සමාස කරනු ලැබෙත් නම් ඒ **තප පුරිස** නම්. විභක්ති සමාස ය යි ද මෙයට ව්‍යවහාර කෙරෙති. විබත් ලොපා සමාස කරන හෙයිනි. මේ සමාසය ප්‍රධාන වශයෙන් දෙකොටසකට බෙදා කාත්‍යායනාචාර්යයන් වහන්සේ දක්වූහ. එනම් ප්‍රථමා තප්පුරිසය, අමාදි තප්පුරිසය කියායි. ඇතැම් ආචාර්ය කෙනකුන්ට ප්‍රථමා තප්පුරිස

සමාසය අභිමත නොවේ. එහෙත් අඩ්ඪපිප්ඵලී ආදිය ප්‍රථමා තප්පුරිස උදාහරණ වශයෙන් දක්වති. නැවත ලොප තප්පුරිසය, අලොප තප්පුරිසය යි භෙද දෙකක් තප්පුරිස සමාසයෙහි භෙද වශයෙන් වෛයාකරණයෝ දක්වති. **අක්ඛනිස්සිතා, කාණභඬකාරෝ.** යනාදිය එයට උදාහරණ කෙරෙති. මේ සමාසය පර පදාර්ථ ප්‍රධානය; වාච්‍ය ලිඞ්ගිකද වේ.

115 **භාවය:**- දිගු සංඥලත් තත් පුරුෂ සමාසය කර්මධාරය සංඥලත් තත් පුරුෂ සමාසය ය යි ප්‍රථමා තප්පුරිස සමාසය විවිධ වේ. අපඤ්චපූලි–අබ්‍රාහමණො යනු උදාහරණ යි.

**වර්ණනා:**- මුලින් දිගු සමාසයෙහි සිඛ පදයක් ප්‍රථමා විභක්ති ලොපයෙන් හා නතීපාතය පිළිබඳ තත් පුරුෂකාර්‍යය වූ අකාරා දෙශය වීමෙන් සිදුවන සංක්ෂෙපය **ද්විගු තත් පුරුෂ ප්‍රථමා සමාස** ය යි. **"අපඤ්චපූලි"** යන්නෙහි ඒ ලක්ෂණ පෙනේ.

ප්‍රථමා විභක්තිය ලොප්ව කර්මධාරය සංඥා හා තප්පුරිස සංඥලත් වෙන් වෙන් පැවැත්ම ඇති එකාර්ථ සමාසය තුල්‍යාර්ථ (කර්මධාර) තප්පුරුෂ සමාසයයි **"අබ්‍රාහමණො"** යන්නෙහි ඒ ලක්ෂණ පෙනේ.

116–117 **භාවය:**- අමාදි තප්පුරිස සමාසය දුතියාදීන්ගේ වශයෙන් සවැදෑරුම්. භූමිගතො – දෙවදත්තො – කඨින දුස්සං අත්තජො–රාජ පුත්තො–ගම වාසී යනු උදාහරණ යි.

**වර්ණනා:**- ප්‍රථමා තප්පුරිසය, අමාදී තප්පුරිස ය යි තප්පුරිස සමාසයෙහි භෙද දෙකක් ලැබෙන බව මුලින් කීමු. අමාදි තප්පුරිස්යෙහී භෙද සයකි.

| | | | |
|---|---|---|---|
| ද්විතියා | තප්පුරිස | සමාසය | භූමිංගතො, **භූමිගතො** |
| තෘතීයා | ,, | ,, | දෙවෙන දත්තො, **දෙවදත්තො** |
| චතුර්ථි | ,, | ,, | කඨිනස්ස දුස්සං, **කඨින දුස්සං** |
| පඤ්චමී | ,, | ,, | අත්තනොජාතො, **අත්තජො** |
| ෂෂ්ඨි | ,, | ,, | රඤ්ඤො පුත්තො, **රාජ පුත්තො** |
| සප්තමී | ,, | ,, | ගාමෙවාසි, **ගාම වාසී** |

118 **භාවය:**- තග්ගුණ බහුබ්බීහි සමාසය, අතග්ගුණ බහුබ්බීහි සමාස යැයි බහුබ්බීහි සමාසයෙහි භෙද දෙකකි. ලම්බකණ්ණො–පබ්බතො යනු උදාහරණයි.

**වණ්ණනා**:- සමස්‍යමාන පදයන් ගෙන් අන්‍ය වූ පදාර්ථයක් උක්ත වේ නම් එය බහුබ්බීහි නම්. ඒ බහුබ්බීහි සමාසය තද්ගුණ අතද්ගුණ යයි භෙද දෙකක ඇතුළත් වේ. විශෙෂණ පදයෙන් කියවෙන ගුණය යමෙකු කෙරෙහි විද්‍යමානද ඒ **තද්ගුණ** නම්. **ලම්බකණ්ණො** යනු උදාහරණයි. එසින් අන්‍ය වූයේ **අතද්ගුණ** යයි. **පබ්බතො** යනු උදාහරණයි. මේ සමාසය වාච්‍යලිඞ්ගිකය අන්‍යපදාර්ථ ප්‍රධානය.

119 **භාවය**:- ආදියෙහි අන්‍ය පදය, මධ්‍යයෙහි අන්‍ය පදය, අන්තයෙහි අන්‍යපදය යෙදීමෙන් බහුබ්බීහි සමාසය තුන් පරිද්දෙකින් වන්නේය. පත්තහත්ථො – අත්තනො – ජිත්තහත්ථො යනු උදාහරණයි.

120–121 **භාවය**:- සුගමය.

**වණ්ණනා**:- බහුව්‍රීහි සමාසය සප්තවිධ වේ. සඞ්ඛ්‍යාභය, විසන්තරාලත්ථ, ව්‍යතිහාර ලක්ෂණ යන අර්ථ ත්‍රයෙහි පළමු විබත වේ. ඡප්පඤ්චවාචා, පුබ්බුත්තරා, දණ්ඩාදණ්ඩි යනු ක්‍රමයෙන් ඔවුනට උදාහරණයි.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | ප්‍රථමා | බහුබ්බීහි | සමාසය | – | **නිග්‍රොධපරි මණ්ඩලො** |
| 2 | ද්විතීයා | ,, | ,, | = | **ආගත සමණො** |
| 3 | තෘතීයා | , | ,, | = | **ජිතින්ද්‍රියො** |
| 4 | චතුර්ථී | ,, | ,, | = | **දින්නසුංකො** |
| 5 | පඤ්චමී | ,, | ,, | = | **නිග්ගතජනකො** |
| 6 | ෂෂ්ඨී | ,, | ,, | = | **ලම්බකණ්ණො** |
| 7 | සප්තමී | ,, | ,, | = | **සුසස්සො** |

122 **භාවය**:- ද්වන්ද සමාසය, ද්විගුසමාසය, කම්මධාරය සමාසය යන මෙකී සමාසයෝ සමුච්චයාර්ථ තුල්‍යාර්ථ වාචකවෙති. අව්‍යයීභාව, තප්පුරිස, බහුබ්බීහි යන සමාසත්‍රය ය නාමානුරූප වූ වෝ වෙති.

123 **භාවය**:- කම්මධාරය, ද්වන්ද, තප්පුරිස යන සමාසත්‍රය ය පරපදයෙහි වූ ලිඟු ලබයි. බහුබ්බීහි සමාසය අන්‍ය වූ පදයෙක ලිඟු ලබයි.

*124* **භාවය:–** දිගු සමාසය හා අව්‍යයීභාව සමාසය නියත යෙන්ම නපුංසක ලිඞ්ගිකය. යුක්තවූ විභක්ති පදාදීන් ගෙන් එය සුබොධය.

125 **භාවය:–** මේ පුණ්‍යය හේතුකොට මම නොබිඳුනු පිරිස් ඇත්තෙක් වෙම්වා, ප්‍රඥාවෙන් හා සමෘතියෙන් යුක්තවූවෙක් වෙම්වා, අවසන්හි සංසාරයෙන් එතරවන්නෙක් ද වෙම්වා.

**සමාසය නිමි.**

# තද්ධිතය.

126 **භාවය:–** වාසිඨාදී ඒ ඒ ශබ්දයන්ට හා ව්‍යාකරණ ශාස්ත්‍රාදග්‍රහණයෙහි නියුක්ත වූ ශිෂ්‍යයනට හිතවූයේ තද්ධිත නම්.

**වණ්ණනා.–** සමාසයෙන් පදයන්ගේ යම් සංක්ෂෙපත්ව යෙක් වෙයිද එයට වඩා කෙටිකිරීමෙක් තද්ධිතයෙන් වෙයි. නාමයෙන් පරව අපත්‍යාදී අර්ථාව බොධය පිණිස "ණ" ආදී ප්‍රත්‍යයන් කොට නිපදවනුයේ **තද්ධිත** නම් වේ. වාසිඨාදී නාම පදයන්ට හිතවූයේ යයි කීයේ එහෙයිනි. නිරුක්ති ශාස්ත්‍රය ඉගෙනීමෙහි නියුක්ත යනට මෙයින් වන ප්‍රයොජනය අනල්ප වේ.

127 **භාවය:–** සාමඤ්ඤ තද්ධිතය, අව්‍යය තද්ධිතය, භාවතද්ධිත යයි තද්ධිතයෙහි භෙද තුනෙකි. එයින් සාමඤ්ඤතද්ධිතය ලිඞ්ග වචනයන් හා සාධාරණවීම් හෙතුයෙන් අනෙක ප්‍රකාර වේ.

**වණ්ණනා:–** තද්ධිතයෙහි ප්‍රධාන වශයෙන් සාමඤ්ඤ, අව්‍යය, භාවයයි භෙද තුනෙක් ලැබේ ලිඞ්ග වචනානුරූපව යම් තද්ධිත යෙක් වේ නම් එසේ වූ තද්ධිතය **සාමඤ්ඤ** නම්. පුල්ලිඞ්ගයෙහි **"වාසිඨො"** සි ද, ස්ත්‍රී ලිඞ්ගයෙහි **"වාසිඨී"** සී ද, නපුංසක ලිඞ්ගයෙහි **"වාසිඨං"** සී ඒ ඒ ලිඞ්ගානුරූපව භෙද තුන වෙයි. එකවචන බහුවචනයන්හි වාසිඨො, වාසිඨා යනාදීන් වරනැගෙයි.

128 **භාවය:–** අව්‍යය තද්ධිතය එසේ ලිඞ්ග වචනයන් නිසා වෙනස් බවක් නො ලබයි. සඳුද, බුඞ් දෙදෙනාගෙන් යුක්තවූයේ භාවයයි. වාසිඨො–තථ්තතා–ඕපමමං යනු උදාහරණයි.

129 **භාවය:**– ත්‍රිවිධ තද්ධිතයන් අතුරෙන් සාමඤ්ඤ තද්ධිතයෙහි භෙද පසළොසකි. ගොත්ත–තර–රාග–ජාති–සමූහ–ඨාන–නිස්සිත – උපමා – බහුල–සෙට්ඨ – අස්සත්ථි–පකති – පූරණ–සංඛ්‍යා–විභාග, යන මොහුයි.

130 **භාවය:**– සරලයි.

**වණ්ණනා:**– තද්ධිතයෙහි දී යම් ප්‍රත්‍යයක් කරනුයේ යම් කිසි අර්ථයක් සලකාගෙනය. "වසිට්ඨ" ශබ්දයා කෙරෙන් ඔහුගේ පුතාය යන අර්ථය සලකා **"වාණපච්චෙ"** යන සූත්‍රයෙන් "ණ" ප්‍රත්‍යය කරනු ලැබේ. ඒ "ණ" ප්‍රත්‍යයෙන් ඔහුගේ පුතාය යන අර්ථය ගැනෙයි. එවිට අපච්ච ශබ්දයක් උවමනා නො කෙරේ. එහි අර්ථය යථොක්ත ප්‍රත්‍යයෙන් ලැබෙන හෙයිනි.

131–132 **භාවය:**– සාමඤ්ඤ තද්ධිතාගත පණ්ණරස විධ භෙදයනට උදාහරණ. 1 **වාසිට්ඨං**, 2 **නාවිකං**, 3 **නීලං**, 4 **පුරිමො**, 5 **ජනතා**, 6 **රජනීයං**, 7 **දුට්ඨුල්ලං**, 8 **ධූමායිතත්ත**, 9 **අභිජ්ඣාලු**, 10 **සෙට්ඨො**, 11 **සද්ධො**, 12 **මණිමය**. 13 **පඤ්චමො**, 14 **විකං**, 15 **විධා** යන මොහුයි.

133 **භාවය:**– ණ– ණායන– ණාන– ණෙය්‍ය– ණි– ණික– ණව–ණෙර–ණ්‍ය, යන මොහු ගොත්ත තද්ධිතයෙහි ප්‍රත්‍යයෝ වෙති.

**වණ්ණනා:**– **"වාණපච්චෙ"** යන සූත්‍රයෙන් **"ණ"** ප්‍රත්‍යයද, **"ණායන ණාන වච්ඡාදිතො"** යන්නෙන් වූ **ණායන**, **ණාන** යන ප්‍රත්‍යවයද, **"ණෙය්‍යො කත්තිකාදීහි"** යන්නෙන් **"ණෙය්‍ය"** ප්‍රත්‍යයද, **"අතො ණි වා"** යන්නෙන් වූ **"ණි"** ප්‍රත්‍යයද, ඒ සූත්‍රයෙහි ම වා ග්‍රහණයෙන් වූ **"ණික"** ප්‍රත්‍යයද, **"ණවොපග්වාදීහි"** යන්නෙන් **"ණව"** ප්‍රත්‍යයද, **"ණෙරවිධවාදිතො"** යන්නෙන් **"ණෙර"** ප්‍රත්‍යයද, **"අතො ණි වා"** යන්නෙහි වාග්‍රහණයෙන් වූ **"ණ්‍ය"** ප්‍රත්‍යයද යන මේ ප්‍රත්‍ය නවය ගොත්ත (අපත්‍ය) තද්ධිත යෙහි වේ.

134 **භාවය:**– තරත්‍යාදී තද්ධිතයෙහි ප්‍රත්‍ය දෙකක්ද, රාගාදී තද්ධිතයෙහි ප්‍රත්‍ය එකක්ද, ජාත්‍යාදී තද්ධිතයෙහි ප්‍රත්‍ය සතරක්ද වෙති.

**වණ්ණනා:**– **"තෙනවා, සංසට්ඨං තරති චරති වහති ණිකො ති ණිකො"** යන සූත්‍රයෙන් **"ණික"** ප්‍රත්‍යයද, **"තමධීතෙ**

**තෙන සතාදි සන්නිධාන නියෝග සිප්පභණ්ඩ ජීවිකා ත්‍ෙථසු ච''** යන්නෙන් කළ **"ණික"** ප්‍රත්‍යයද, තරාදී තඩිතය වේ. **"ණරාගාතෙනරත්තං තස්සෙද මඤ්ඤත්‍ෙථසුච"** යන්නෙන් වන **"ණ"** ප්‍රත්‍යය රාගාදී තඩිතයටද, **"ජාතාදින මිමියාච"** යන සූත්‍රයෙන් **ඉම, ඉය** යන ප්‍රත්‍ය දෙක හා එහිම චග්‍රහණයෙන් **"කිය"** ප්‍රත්‍යයද, ආදි ශබ්දයෙන් වූ **"ඉය"** ප්‍රත්‍යයද, යන ප්‍රත්‍ය සතර ජාත්‍යාදි තඩිත යෙහි වේ.

135 **භාවය:–** සමූහ තඩිතයෙහි ප්‍රත්‍ය තුනක්ද, ඨාන, නිස්සිත, උපමා බහුල යන තඩිතයන්හි එක එක ප්‍රත්‍යයද යන වශයෙන් ප්‍රත්‍ය සතරක් වේ.

**වණ්නා:–** **"සමූහත්‍ෙථ කණ්ණා ච"** යන සූත්‍රයෙන් වන **"කණ්"** ප්‍රත්‍යය හා **"ණ"** ප්‍රත්‍යයද, **ගාමජන බන්ධු සහායාදීහිතා"** යන සූත්‍රයෙන් වන **"තා"** ප්‍රත්‍යයද, සමූහ තඩිතයෙහි ප්‍රත්‍යවෙති. **"තදස්සඨාන මියොච"** යන සූත්‍රයෙන් වන **"ඊය"** ප්‍රත්‍යය ඨාන තඩිතයෙහි ප්‍රත්‍යයයි. **"තනනිස්සිතත්‍ෙථලො"** යන සූත්‍රයෙන් වන **"ල"** ප්‍රත්‍යය නිස්සිත තඩිතයෙහි ප්‍රත්‍යය වේ. **"උපමත්‍ථායිතත්තං"** යන සූත්‍රයෙන් වන **"ආයිතත්ත"** ප්‍රත්‍යය උපමා තඩිතයෙහි ප්‍රත්‍යයයි. **"ආලුතබ්බහුලෙ"** යන සූත්‍රයෙන්වන **"ආලු"** ප්‍රත්‍යය බහුල තඩිතයෙහි ප්‍රත්‍යය වේ.

136 **භාවය:–** විසිඨතඩිතයෙහි ප්‍රත්‍ය පසෙක්ද, අස්සත්‍ථි තඩිත යෙහි ප්‍රත්‍ය නවයක් දැයි මෙසේ ප්‍රත්‍ය තුදුසෙක් මෙයින් දැක්වේ.

**වණ්නා:–** **"විසෙසෙතර–තම–ඉස්සික–ඉය–ඉඨා වා"** යන සූත්‍රයෙන් වන **"තර–තම–ඉස්සික–ඉය–ඉඨ"** යන ප්‍රත්‍ය පඤ්චකය විසිඨ තඩිතයෙහි ප්‍රත්‍යයෝයි. **"තදස්සත්‍ථීතිවීච"** යන සූත්‍රයෙන් වන **"වී"** ප්‍රත්‍යය හා එහිම චග්‍රහණයෙන් වන **"සො"** ප්‍රත්‍යයද **"තපාදිතොසී"** යන්නෙන් වන **"සී"** ප්‍රත්‍යයද, **"දණ්ඩාදිතො ඉකඊ"** යන්නෙන් වන **"ඉක, ඊ"** ප්‍රත්‍යයන්ද, **"මධ්වාදිතොරො"** යන්නෙන් විහිත **"ර"** ප්‍රත්‍යයද, **"සද්ධාදිතොණො"** යන්නෙන් වන **"ණ"** ප්‍රත්‍යයද, **"ගුණාදිතොවන්තු"** යන්නෙන්වන **"වන්තු"** යන්නද, **"සත්‍යාදීහිමන්තු"** යන්නෙන් වන **"මන්තු"** ප්‍රත්‍යයද, යන මේ ප්‍රත්‍ය නවය අස්ත්‍යර්ථ තඩිතයෙහි ප්‍රත්‍යයො වෙති.

137 **භාවය:–** ප්‍රකෘති තඩිතයෙහි **"මය"** ප්‍රත්‍යයද පූරණ තඩිතයෙහි **ම–ඊ–ථ–ඨ–තිය,** යන ප්‍රත්‍ය පසද, සඞ්ඛ්‍යා තඩිතයෙහි

"ක" ප්‍රත්‍යයද, විභාග තද්ධිතයෙහි "ධා" "සො" යන ප්‍රත්‍ය වයද යන මේ ක්‍රමයෙන් සියලු සාමඤ්ඤ තද්ධිතයෙහි සතළිස් හය දෙනෙක් ප්‍රත්‍යයෝ වෙති.

**වණ්ණනා:-** ප්‍රකෘති තද්ධිතයට නියමිත වූ "මය" ප්‍රත්‍යය "**තප්පකතිවචනෙ මයො**" යන සූත්‍රයෙන් වෙයි. "**සඞ්ඛ්‍යාපූරණෙ මො**" යන්නෙන් "ම" ප්‍රත්‍යයද, "**ඒකාදිතො දසස්සී**" යන්නෙන් "ඊ" යන ප්‍රත්‍යයද, "**චතුච්ඡෙහි ථඨා**" යන්නෙහි "ථ, ඨ" යන ප්‍රත්‍ය දෙකද, "**ද්විතීහි තියො**" යන්නෙන් වූ "**තිය**" ප්‍රත්‍යයද, යන මේ ප්‍රත්‍යපස සඞ්ඛ්‍යා තද්ධිතයෙහි ප්‍රත්‍යයෝ වෙති. "**ද්වාදිතො කොනෙකත්ථෙ**" යන සූත්‍රයෙන් වන "ක" ප්‍රත්‍යයද සඞ්ඛ්‍යාතද්ධිතයෙහි ප්‍රත්‍යය වේ. "**විභාගෙ ධා ච**" යන සූත්‍රයෙන් වන "ධා" ප්‍රත්‍යයද එහිම චග්‍රහණයෙන් වන "**සො**" ප්‍රත්‍යයද විභාග තද්ධිතයෙහි ප්‍රත්‍යයෝ වෙති. මෙසේ ගොත්ත තද්ධිතයෙහි ප්‍රත්‍ය නවයක් ද තරත්‍යාදි තද්ධිතයෙහි ප්‍රත්‍යවයක්ද, රාගාදී තද්ධිතයෙහි එකක්ද, ජාත්‍යාදි තද්ධිතයෙහි සතරක්ද, සමූහතද්ධිතයෙහි තුනක්ද ඨාන, නිස්සිත, උපමා, බහුල යන තද්ධිතයන්හි එක එක ප්‍රත්‍යයද, විශිෂ්ඨ සෙෂ්ඨ) තද්ධිතයෙහි පසෙක්ද, අස්ත්‍යර්ථ තද්ධිතයෙහි නවයක්ද, ප්‍රකෘති තද්ධිතයෙහි එකක්මද, පූරණ තද්ධිතයෙහි ප්‍රත්‍ය පහක්ද, සංඛ්‍යාතද්ධිතයෙහි එකක්මද, විභාග තද්ධිතයෙහි දෙකක්ද, යන මේ ක්‍රමයෙන් සාමඤ්ඤ තද්ධිතයෙහි ප්‍රත්‍ය සතළිස් හදෙනෙක් වෙති.

138 **භාවය;-** සාල්ල (උරිය) කදමා එක් අංශයකින් දැරිය යුතු මහත් බරක් කදකින් සුවසේ ගෙනයන්නට හැක්කාක්මෙන් පද ගණනකින් කිය යුතු අර්ථය එක (තද්ධිත) ප්‍රත්‍යයකින් පළ කිරීමට ඔවුන්වාක්‍ය මධ්‍යයෙහි යෙදිය යුතුවේ.

**වණ්ණනා:-** යම් කිසි පැසකින් ඉතා දුකසේ ගෙනයා යුතු මහත් බරක් කදක ලාගැනීමෙන් ගෙනයාමට ඉතාම ලෙහෙසි වේ. එමෙන් පද තුන හතරකින් කිය යුතු වූ දෙය එක අකුරක් යොදා ගැනීමෙන් ඒ අර්ථය ලබාගැනීමට ඉවහල් වේ නම් එය භාෂාවට සැරෙන මහත්ම උපකාරයකි. වසිෂ්ඨ, **අපච්ච** යන පදදෙකකින් කිය යුත්ත වසිෂ්ඨ යන්නෙන් පරව "ණ" කාරයක් යෙදීමෙන් ඒ අර්ථය ලැබේ. ඒ ප්‍රත්‍යය යෙදිය යුත්තේ වසිෂ්ඨ-අපච්ච යන පදදෙකින් මූල්පදය ලභය. ඒ වාක්‍ය මධ්‍යයකි.

139 **භාවය:-** වාක්‍යාවස්ථායෙහි පවත්නා විභක්ත්‍යාදිය තද්ධිතයෙහි දී ලොප්වේ. එසේ වූවද ඔවුන් කෙරෙන් වන "ණ" ආදි ප්‍රත්‍යයෝ ඒ අර්ථයම ප්‍රකාශ කෙරෙති.

140 **භාවය:-** හිරු රැස් හා ගැටීමෙන් සූර්‍ය්‍යකාන්ත පාෂාණ යෙන් හටගන්නා ගින්න පසුව ඒ පාෂාණය නැතිවූවද නැති නොවන්නාක් මෙන්ම මුල දී පැවති පද විභක්ත්‍යාදිය ලොප්වූවද, ඒ පිණිස පසුව කරන ප්‍රත්‍ය තද්ධිතයෙහි දී යථොක්තාර්ථ දරති.

141–142 **භාවය;-** සුගමයි.

**වණ්ණනා:-** ථ-ථත්තා-ථං-ථො-ත්‍ර-ථා-ව-හිං-හං-හිංචන-හිං හධ-දා-දානි-දාචනං-රහි-ධුනා යන ප්‍රත්‍ය අටළොස කාත්‍යායන සූත්‍රයන්හි පැනෙයි. අතිත් ප්‍රත්‍ය දසය (පැනෙනුයේ නවයෙකි) චූලනිරුත්ත්‍යාදි ග්‍රන්ථයන්හි පැනෙයි.

**භාවය:-** සුගමයි.

**වණ්ණනා;-** ණ්‍ය, ත්ත, තා, ත්තන, ත්ථ, ත්ව, ණීල, ණීක, ණීය, කණ්, ණ යන මේ ප්‍රත්‍යයෝ භාව තද්ධිතයෙහි ප්‍රත්‍යයෝ යි. ණ්‍ය, ත්ත, තා යන ත්‍රිවිධ ප්‍රත්‍යයෝ **"ණ්‍ය ත්ත තා භාවෙතු"** යන්නෙන් විහිතය. ත්තන, ත්ථං, ත්වං, ණීලං, ණීකං යන ප්‍රත්‍ය යථොක්ත සූත්‍රයෙහි තු ග්‍රහණයෙන් ගත්හ. **"රමණීයාදිතො කණ්"** යන්නෙන් **"කණ්"** ප්‍රත්‍යය ද, **"ණ විසමාදීහි"** යන්නෙන් **"ණ"** ප්‍රත්‍යය ද යන මේ එකොළොස ද කාත්‍යාය නය අනුව දතයුත්තාහ. සාමඤ්ඤ තද්ධිතයෙහි ප්‍රත්‍ය සතළිස් හය (46) ක් ද, අව්‍යය තද්ධිතයෙහි ප්‍රත්‍ය විසි අට (28) ක් ද, භාව තද්ධිතයෙහි හතර (4)ක් දැ යි මුළු තද්ධිතයෙහි ප්‍රත්‍ය අසූපහ (85) කි.

144 **භාවය:-** සුගමයි.

145 **භාවය:-** මේ තද්ධිතයෙහි භෙද දක්වා ලූ පිනෙන් සහ පත් මිත්‍රයන් ඇතිව බුදුරදුන් වැණූ දූය කිරීමටම ලැබෙම්වා ශ්‍රද්ධාදී පඤ්ච ඉන්ද්‍රියයන් ගෙන් යුක්ත වෙම්වා.

**සොදාහරණ තද්ධිත කාණ්ඩය නිමි.**

# ආඛ්‍යාතය.

146 **භාවය:**– විකරණ ප්‍රත්‍යයන් හා විභක්තීන් ද, භාව–කර්තෘ කර්ම යන කාරකයන් ද, ප්‍රකාශ කරන්නේ ආඛ්‍යාත ය යි.

**වර්ණනා:**– **“භාව කම්ම කත්තාරං ආඛ්‍යායන්ති = ජෝතෙන්ති ති = ආඛ්‍යාතං”**– භාවාදී කාරකයන් හා අ ආදී විකරණයන් ද, **ති** ආදී විභක්තීන් ද ප්‍රකාශ කරනුයේ **ආඛ්‍යාත** නම් වේ. **“ආඛ්‍යායන්ති” ආචක්ෂතෙ කර්තෘව්‍යාපාර මිත්‍යාඛ්‍යාතඃ”** යි සකු වියරණැදුරෝ ආඛ්‍යාතය හැඳින් වූ හ. යම් විභක්ති සමුදායක් භාවාදී ක්‍රියාව පළකෙරේ නම් හේ ආඛ්‍යාත නමැ යි ද සමහරු කියති.

147 **භාවය:**– භාව, කර්ම, කර්තෘ යන ක්‍රියා වාචක විභක්ති අටෙකි. ඒ වර්තමානාදිහු යි.

**වර්ණනා:**– පූර්වෝක්ත ආඛ්‍යාත ප්‍රත්‍යයෝ කොටස් අටකට බෙදූ වෛය්‍යාකරණයෝ දක්වති. තත් ප්‍රත්‍යයෝ කර්මකාරක, කර්තෘකාරක යන මොවුහු ප්‍රකාශ කෙරෙති. වෛය්‍යාකරණයෝ ඒ අට මෙසේ මේ නාමයන් ගෙන් හඳුන්වති. **පඤ්චමී–වත්තමානා– සත්තමී– හීයත්තනී– අජ්ජතනී– පරොක්ඛා–** භවිස්සන්තී– **කාලාති පත්ති** යන වශයෙනි.

148 **භාවය:**– යථෝක්ත විභක්තීහු අටදෙන වෙන් වෙන්ව පරස්මෛපදය යි ආත්මනෙ පදය යි දෙපරිදි වේ. පූර්ව වූ සදෙන පරස්ස පදයයි ද, අපරවූ සදෙන අත්තනො පදයයි ද දන්නේ යි.

**වර්ණනා:**– යථෝක්ත විභක්තීන්ට නියමිත ප්‍රත්‍ය සයානූවක් වෙති. එක් විභක්තියකට ප්‍රත්‍යයෝ ද්වාදසයෙකි. ඔවුහු සියලු විබෙහෙහිදිම කොටස් දෙකකට බෙදෙති. එනම් පරස්මෛපදය ආතමනෙ පදය කියා යි. එයින් ප්‍රථමවූ තු, අන්තු ආදී සය (6) පරස්මෛ පද වශයෙන්ද, තං, අන්තං ආදී අපර විභක්ති සය (6) ආතමනෙ පදය යි ද හඳුන්වති. ක්‍රියාවෙන් ලැබෙන ඵලය තමා කරා ඒනම් ඒ ආතමනෙ පද නමැයි කිහු. අෂ්ට විභක්තියෙහිදීම මෙසේ සැලකිය යුතු.

149–**භාවය:**– ඒ විපදයන් අතුරෙන් එක් එක් පදයක් නාම, තුම්හ, අම්හ, ශබ්දයන්ගේ යෝග වශයෙන් ත්‍රිවිධ වෙති. පුබ්බ, මජ්ඣ, අපර යනාදී වශයෙන් ඔවුන්ගේ යෙදීම වෙයි.

**වර්ණනා:**- සියලු විබත්හිම අත්තනෝපද, පරස්ස පදයයි දෙපද කොටෙකු ලැබෙන බව මුලින් කීමු. මෙයින් කියනුයේ ඒ පද දෙදෙන එක් එක් පද වශයෙන් සලකා කොටස් තුනකට බෙදීමයි. කෙසේදයත්? පරස්සෙම පදයට නියමිත ෂට් විධ ප්‍රත්‍යයෝ දෙක දෙක කොටස් තුනකට බෙදා ඔවුන් නාම, තුම්හ, අම්හ, ශබ්ද යන් හා යෙදවිය යුතු. එහි ක්‍රමය මෙසේයි. මුල් ප්‍රත්‍ය දෙක සමග නාමයද, දෙවන ප්‍රත්‍ය දෙක සමග තුම්හ ශබ්දයද, තෙවන ප්‍රත්‍ය දෙක සමග අම්හ ශබ්දයද යන ක්‍රමයෙනි. ආත්මනෙ පදයෙහි යෙදීමද මෙසේයි.

150–**භාවය:**- නැවතද පුරුෂ භෙද වශයෙන් හෙදත්‍රයෙක් වෙති. පූර්ව, මධ්‍ය, අපර යන වශයෙන් පඨම, මජ්ඣිම, උත්තමය යි පුරුෂ තුනකි.

**වර්ණනා:**- විබත්ත මුල් ප්‍රත්‍ය සදෙන පරස්ස පදය යි ද, අපර සදෙන අත්තනො පදය යි ද දැක්වීමු. මෙයින් කියනුයේ එසේ වී හෙද පද කොටස් තුනකට බෙදීමයි. එය පුරිසාදී වශයෙනි. **වත්තමාන** විභත්තියෙහිදී ති, අන්ති යන දෙක **පඨම පුරිස** ය යි ද සි, ථ යන දෙක **මජ්ඣම පුරිස** ය යිද, මි, ම යන දෙක **උත්තම පුරිස** ය යිද ප්‍රකාශ කෙරෙති. එසේම අත්මනෙ පදයෙහිද යොදා ගත යුතුයි. සෙසු විභත්තීන්හිද මේ ක්‍රමය මෙසේ මැයි.

| **ප්‍රථම පුරුෂය.** | | **මධ්‍යම පුරුෂය.** | |
|---|---|---|---|
| **ති** | **= සො ඔදනං පචති.** | **සි** | **= ත්වං ඔදනං පචසි.** |
| **අන්ති** | **= තෙ ඔදනං පචන්ති.** | **ථ** | **= තුම්හෙ ඔදනං පචථ.** |

**උත්තම පුරුෂය.**

**මි = අහං ඔදනං පචාමි.**
**ම = මයං ඔදනං පචාම.**

මේ පරස්සෙම පදයට දෘෂ්ටාන්තය. අනිකුත් විභත්තීන්හිද මෙසේම සලකනු. තුම්හ, අම්හ ශබ්දයන් කෙරෙන් අන්‍යවූ නාමයන් සමග ප්‍රථම පුරුෂයද, තුම්හ ශබ්දය සමග මධ්‍යම පුරුෂයද අම්හ ශබ්දය සමග උත්තම පුරුෂයද යෙදෙති.

151 –**භාවය:**- ඒ ත්‍රිවිධ පුරුෂයන් අතුරෙන් මුලින් යෙදෙන **ති–සි–මි** යන තුන එක වචනද, **අන්ති–ථ–ම** යන තුන බහු වචනද වෙති.

152 –භාවය:– විභත්තීහු ජාති වශයෙන් අටෙකි. පද වශයෙන් සොළසෙකි. යොග වශයෙන් 48 කි. එසේම පුරුෂ වශයෙන් අට සාළිසකි.

**වණ්ණනා:**– වත්තමාන –පෙ– කාලාතිපත්ති යයි ජාති වශයෙන් අට (8) මෙසේ දතයුතුයි. පද වශයෙන් සොළසකැයි කීවේ විබත් අටෙහිම පරස්ස පද, අත්තනො පද වශයෙන් එක විබත්කට දෙක බැගින් වූ කල ලැබෙන භෙද වශයෙනි. යොග වශයෙන් සතළිස් අට (48) කි. ඒ මෙසේයි. නාම, තුම්හ, අම්හ යන වශයෙන් පරස්ස පදයෙහි තුනක්ද, අත්තනො පදයෙහි තුනක්දැයි සයෙක් වෙති. සියලු විබතෙහිම එසේ ලැබුන කල අටසාළිසෙකි. පුරුෂ වශයෙන්ද පරස්ස පදයෙහි පුරුෂ තුනක්ද, ආත්මනෙ පදයෙහි පුරුෂ තුනක්ද ලැබෙයි. එසේවූ සය අට විබතෙහිම ලැබෙනවිට අට සාළිසකි.

153 –භාවය:– විභත්තීහු අටදෙන එක වචන බහු වචන යන්ගේ වශයෙන් සයානූවක් වෙති.

**වණ්ණනා:**– වත්මානාදි විභක්ති අටෙහි පරස්ස පදයෙහි ප්‍රථම මධ්‍යම, උත්තම යන පුරුෂත්‍රයෙහි එකවචනය බහුවචනය වශයෙන් වචන අට සාළිසක්ද, අත්තනො පදයෙහි අට සාළිසක්දැයි එකවචන, බහුවචන සයානූවක් ලැබෙති. පරො පුරුෂ භෙදයෙන් අසූවෙක්වේ. ප්‍රථම පුරුෂය හා මධ්‍යම පුරුෂයද, ප්‍රථම පුරුෂය හා උත්තම පුරුෂයද, මධ්‍යම පුරුෂය හා උත්තම පුරුෂයද යන මොවුන්ගේ එක්කොට කීමෙක් ඇති කල කියවෙන පුරුෂය "**පරොපුරුෂය**", නම්වේ. **"සබ්බෙ සමෙකාභිධානෙ පරෙ පුරිසො"** යනු පැරණියන් එය හැඳින්වූ තියායි.

154 –භාවය:– ති–සි–ථ වාරය, ති–මි–ම වාරය, සි–මි -ම වාරය ති, සි, ථ වාරය, ති, අන්ති, සි, ථ, මි, ම වාරය යන පස්වැ වාරය පරො පුරුෂ ග්‍රහණයේදී ලැබේ.

**වණ්ණනා:**– ක්‍රියාව කරන සාත්‍යවරු දෙතුන් දෙනෙක් ප්‍රථම මධ්‍යමාදි පුරුෂයන්ගෙන් සිටි කල පසුව යෙදෙන පුරුෂයට හිමි බහු වචනය ගැනීම රීතියකි. පරො පුරුෂ ග්‍රහණ නාමයෙනුදු සැලකෙනුයේ එයමය. "සො ච පචති, ත්වං"ච පචසි. යනවාක්‍ය දෙක ප්‍රථම මධ්‍යම පුරුෂයන්ගෙන් යුක්තවිය. එය පරො පුරුෂ ග්‍රහණය

වන විට යෙදිය යුත්තේ "**තුම්හෙ පචථ**" කියා යි. මේ ද්විතීය වාර යයි. "**ත්වං ච පචසි, අහං ච පචාමි**" යි මධ්‍යම, උත්තම පුරුෂ දෙක එක ක්‍රියාවකලා එක්කොට කියයුතු කල්හි පරෝ පුරුෂ ග්‍රහණය කරනුයේ "**මයං පචාම**" යනුවෙනි. මේ තෘතීය වාරයයි. "අහංච පචාමි සොච පචති ත්වංච පචසි, යන මේ උත්තම–ප්‍රථම–මධ්‍යම පුරුෂ තුන එක් ක්‍රියාවක ලා එක්කොට කිය යුතු කල්හි පරෝ පුරුෂ ග්‍රහණය කරනුයේ '**මයං පචාම**" කියා යි. මේ චතුර්ථ වාරයයි. 'සොච පචති, තෙච පචන්ති, ත්වංච පචසි තුම්හෙ ච පචථ, අහං ච පචාමි" යන මේ සියල්ල එක් ක්‍රියාවක ලා එක්කොට කියයුතු කල්හි පරෝ පුරුෂය ගනීනම් එයද යෙදියයුත්තේ "**මයං පචාම**" කියායි. මේ පරස්ස පද දසය ලැබෙන පඤ්චම වාරය යි. ආත්මනෙ පදයෙහිද ලැබෙන මේ පස් වාරය එක්වීමෙන් වර්තමාන විභක්තියෙහි පරපුරුෂ වාර දශයෙක් වේ. පඤ්චමී ආදි සෙසු විභක්ති සතද දශය දශය බැගින් පර පුරුෂ වාර ලබන නිසා ආඛ්‍යාතයෙහි විභක්තීන්ගේ භෙද අසූ වෙක් වේය යි කීම සහේතුක ය. සද්ද නීතියෙහි එක විභක්තියක වාර දොළසක් ලැබේයයි දක්වා තිබේ. පරෝ පුරුෂය යෙදෙන්නේ මධ්‍යම උත්තම පුරුෂ දෙකේ පමණෙකි. ප්‍රථම පුරුෂයෙහි පරපුරුෂ භාවයක් නැත්තේ ය. විස්තරාර්ථීන් ශබ්ද නීතිය බැලිය යුතු.

155 **භාවය:**– සුගමයි.

**වර්ණනා:**– පච්චුප්පන්න කාලයෙහි වර්තමාන විභක්තිය වෙයි. සො ගාමං ගච්ඡති යනු උදාහරණයි. භාෂායෙහි යෙදී තිබෙන උදාහරණ අනුව සලකා බලනවිට අතීතානාගතාර්ථයන් හි ද එය යෙදෙන බව කිය යුතු වේ. "**කුතො නු ත්වං ආගච්ඡසි, පුරෙ අධම්මො දිප්පති.**" යනු ඔවුනට උදාහරණයි. භවිස්සන්ති විබත නොපැමිණි කාලයෙහි වේ. **සො ගාමං ගච්ඡිස්සති.**" යනු උදාහරණයි. "**පඤ්චමී–සත්තමී**" විභක්ති දෙක අතීත කාලය හෙවත් පසුවූ කාලයෙහි ම වේ.

156 **භාවය:**– අෂ්ට විභක්තීන් පිළිබඳ පරස්සෙපදය කර්තෘම ප්‍රකාශ කරයි. ආත්මනෙ පදය භාව, කර්ම, කර්තෘ යන කාරක තුන ප්‍රකාශ කරයි.

157–158 **භාවය:**– සුගමයි.

**වර්ණනා:**– කර්තෘ කර්ම භාව යන මේ කාරකයන් හි ආඛ්‍යාත විෂයෙහි ලැබෙන ප්‍රත්‍ය තිස්එකකි. "**තිජ ගුපකිත මානෙහි**

**ඛඡසාවා**" යන්නෙන් වූ **ඛ–ඡ–ස** යන ප්‍රත්‍ය තුනකි. තිතික්ඛති. ජිගුච්ඡති වීමංසති යනු උදාහරණයි. "**ආයනාමතො කත්තුප මානාදාචාරෙ**" යනුවෙන් "**ආය**" ප්‍රත්‍යය වේ. පබ්බතායති යනු උදාහරණයි, "**ඊ යූපමානාච**" යන්නෙන් **ඊය** ප්‍රත්‍යය වේ. ඡත්තීයති යනුඋදාහරණයි. "**නාමම්හාතත්තිච්ඡත්ථෙ**" යනුවෙන් "**ඊය**" ප්‍රත්‍යය වේ. පත්තීයති යනු උදාහරණයි. "**ධාතූහි ණෙණය ණා පෙණාපයා කාරිතානි හෙතුවත්ථෙ**"යන සූත්‍රයෙන් **ණෙ–ණය ණාපෙ–ණාපය** යන ප්‍රත්‍යචතුෂ්කය වේ. චොරෙති, චොරයති, චොරාපෙති, චොරාපයති යනු ඔවුනට උදාහරණයි. යථොක්ත සූත්‍රයෙහි අත්‍ථග්‍රහණයෙන් ජෝතලති යනාදියෙහි "**අල**" ප්‍රත්‍යය වේ. "**ධාතුරූපෙ නාමස්මා ණයොච**" යන සූත්‍රයෙන් විසුද්ධයති යනාදියෙහි "**ණය**" ප්‍රත්‍යය වේ. එහිම චග්‍රහණයෙන් "**ආර, අල**" යන ප්‍රත්‍යයවීමෙන් සන්තරාලති, උපක්කමාලති යනාදිය සිද්ධවේ. "**භාවකම්මෙසු යො**" යන්නෙන් "**ය**" ප්‍රත්‍යය වේ. ඨීයතෙ යනු උදාහරණයි. "**භූවාදිතො අ**" යන සූත්‍රයෙන් "**අ**" විකරණ ප්‍රත්‍යය වේ. භවති යනු උදාහරණයි. "**රුධාදිතො නිග්ගහීත පුබ්බංච**" යන්නෙන් වන නිග්ගහීත පූර්ව (අ) ප්‍රත්‍යයට රුන්ධති යනු උදාහරණයි. එහිම චග්‍රහණයෙන් "**ඉ–ඊ–එ–ඔ**" යන විකරණ ප්‍රත්‍යවීමෙන් රුන්ධිති රුන්ධීති රුන්ධෙති රුන්ධොති යන පද සිද්ධවෙයි. "**දිවාදිතො යො**" යනුවෙන් "**ය**" ප්‍රත්‍යය වේ. දිබ්බති යනුඋදාහරණයි. "**ස්වාදිතො ණුණා උණාච**"යන සූත්‍රයෙන් ස්වාදි ගණයෙහි විකරණ ප්‍රත්‍ය තුනක් වේ. ණු–ණා–උණා යන මොහුයි. සුණොති සුණාති–සුණන්ති යනු උදාහරණයි. කියාදිගණයෙහි"**කියාදිතොනා**" යන්නෙන් "**නා**" විකරණය වේ. කිණාති යනු උදාහරණයි. ගහාදිගණයෙහි වන විකරණ දෙකකි. ප්ප–ණ්හා යන මොහුයි. ඝෙප්පති, ගණ්හාති යනු උදාහරණයි. ඔවුන් වනුයේ "**ගහාදිතො ප්පණ්හා**" යන සූත්‍රයෙනි. තනාදී ගණයෙහි "**තනාදිතො ඔයිරා**" යන සූත්‍රයෙන් "**ඔ යිර**" යන ප්‍රත්‍යයවීමෙන් කරොති කයිරති යන පද සිද්ධවෙයි. "**චුරාදිතො ණෙණයා**" යන සූත්‍රයෙන් "**ණෙ–ණය**" යන ප්‍රත්‍යයවී චොරෙති චොරයති යනු සිද්ධවේ. මෙසේ මේ උදාහරණ සලකා බලනවිට ආඛ්‍යාත විෂයෙහි භාව කර්ම කාරකයන්හි වන ප්‍රත්‍යය දෙතිසක් පෙනෙ නත් "**ඊ**" ප්‍රත්‍යය හැර මෙහි ප්‍රත්‍ය එක් තිසක් දක්වා තිබේ ඇතැම් ආචාර්‍ය්‍ය වරු තනාදි ගණයෙහි වන "**යිර**" යන විකාරණය ඔයන් නට වූ ආදෙශයක් ලෙස සලකති. එවිටද යථොක්ත ප්‍රත්‍ය එක් තිසම මෙහි ලැබෙන බව සැලකිය යුතුයි.

159 **භාවය:**– සුගමයි.

**වණ්නා:**– යම් ක්‍රියාවක යෙදෙවීම් වශයෙන් වන්නේ **කාරිත** ය යි. ඒ කාරිත ප්‍රත්‍ය පසකි. ඔවුහු නම් **ණෙ–ණය ණාපෙ – ණාපය – අල** යන මොහුයි. සෙසු සවිස්ස **අකාරිත** ප්‍රත්‍ය වෙති.

160 **භාවය:**– ධාතු, විභක්ති, ගණ, ප්‍රකෘති ප්‍රත්‍යයන්ගේ මධ්‍යයෙහි ධාතු ගණ හඳුන්වා ගැනුමට යෙදෙන ප්‍රත්‍ය විකරණ නම් වෙත්. නිග්ගහීතය හා ඉවණ්ණය ආගම වශයෙන් වේ යයි දත යුතුයි.

**වණ්නා:**– භූවාදි ධාතුන්ගේ හා ති ආදි විභක්තීන්ගේ මධ්‍යයෙහි විශේෂාර්ථයක් සලකා කරන ප්‍රත්‍යය **විකාරණ** නම් වේ.

**"පුබ්බාපරභාගඨානා – භින්නාධාතු විභත්තියො**
**නිස්සාය පච්චයා හොන්ති – යෙනෙවිකාරණා සියුං"**සි

පැරණියෝ විකාරණය හැඳින් වූහ.

| **ගණය.** | **විකාරණ.** | **උදාහරණ.** |
|---|---|---|
| භූවා,දි= | **අවිකාරණය**= | භවති – මූසති |
| රුධා,දි= | **නිග්ගහීත පුබ්බ, අ, විකාරණය** = | රුන්ධති – සිඤ්චති |
| දිවා,දි= | **ය විකාරණය** = | දිබ්බති – හස්සති |
| සවා,දි= | **ණු, ණා, උණා** = | සුණොති–සුණාති–පාපුණාති |
| කියා,දි= | **නා** = | ජිනාති – චිනාති |
| ගහා,දි= | **ප්ප ණ්හා** = | ඝෙප්පති – ගණ්හාති |
| තනා,දි= | **ඔ–යිර** :: | තනොති – කයිරති |
| චුරා,දි= | **ණෙ–ණය**= | චොරෙති – චොරයති |

රුධාදි ධාතු ගණයෙහි වන විකරණයද අකාරය මැයි. භූවාදි ගණයෙහි විකරණයද අකාර යයි. මේ දැක හඳුන්වා ගැනීමට රුධා දි ගණයෙහි දි නිග්ගහීතා ගමය හා ඉවණ්ණාගමයද වන බව සිත තබාගත යුතු වේ.

161 **භාවය:**– සුගමයි. (කතෘගේ ඉෂ්ට ප්‍රාර්ථනය.)

**සොදාහරණ ආඛ්‍යාත භෙදය නිමි.**

# කිතකය.

162 **භාවය:-** ආධුනිකයන්ගේ සැකය දුරු කරන්නේය යන අර්ථයෙන්ද, යම් ප්‍රත්‍යාදියක් ශිෂ්‍යයනට හිතාර්ථ සිද්ධියක් කෙරේය යනු අරුතින්ද, ශබ්දාර්ථ ජානනයෙහි සමත් වූ ඒ ප්‍රත්‍යයෝ කිතක නම් වෙත්.

**වර්ණනා:- කරොතීති=කිත්, කිත්, එව=කිතකො** ධර්ම ශාස්ත්‍රාද්ග්‍රහණයෙහි නියුක්ත ශිෂ්‍යයන්ගේ තද් ජානනය සුවසේ කෙරේය, යන අරුතින් **කිතක** නම් වේ. ධාතු ප්‍රත්‍යයන්ගේ සංයොගයෙන් කිතකයන්ගේ උත්පාදනය වෙයි. ආඛ්‍යාතයෝද ධාතු ප්‍රත්‍යයන්ගේම එක්වීමෙන් සිදුවෙති. එසේ වූ කල ආඛ්‍යාත කිතකයන්ගේ වෙනස් බවෙක් නො පෙනේ. එසේ වුවද එහි වෙනසෙක් ඇත. ආඛ්‍යාත පදයෙන් ක්‍රියාර්ථයත් සමග කාල, කාරක, පුරුෂ යන මොහු උක්ත වෙයි. කිතකයෙන්ද මොවුන්ම කිය වෙතත් ආඛ්‍යාතයෙහි කර්ම, කර්තෘ, භාව යන මොහු, වාච්‍ය වෙති. කිතක යෙහි දී ෂට් කාරකය හා භාවය ද වාච්‍යවෙයි. කිතකය නාමයක් හෙයින් කර්මාදි විභක්තීන්හි හා එක වචන බහු වචනද ඇත්තේයි.

163 **භාවය;-** කිත්‍ය, කිච්චය, කිතකිච්ච ය යි. කිතකයෙහි කොටස් තුනකි. ඔවුහු කර්තෘ, භාව, කර්ම යන කාරකයන්හි යෙදෙති.

**වර්ණනා:-** මෙසින් පැවසුනේ කිතකයෙහි භෙදත්‍රයකි. **කිත්, කිච්ච, කිතකිච්ච** යනු ඒ තුනවෙති. කර්ම කර්තෘ කාරකයන්හි වන ප්‍රත්‍යයෝ **කිත්** නාමයෙන්ද, භාව කර්ම කාරකයන්හි වන ප්‍රත්‍යයෝ **කිච්ච** නාමයෙන්ද, කාරකත්‍රයයෙහි වන ප්‍රත්‍යයෝ **කිතකිච්ච** ය යි ද සලකති. මේ ග්‍රන්ථයෙහි **කිත්, කිච්ච, කිතකිච්ච** යයි ප්‍රත්‍ය කොටස් තුනක් දැක්වූවද, **රූප සිද්ධි** ආදියෙහි එනුයේ **කිත, කිච්ච** යන ප්‍රත්‍යය දෙකොටස පමණෙකි.

164 **භාවය:-** යොකරොති කත්තා යනු කර්තෘ කාරකයට උදාහරණයි. පචීයතෙති පචිතා යනු භාව කාරකයට උදාහරණයි. කාතවෙ ඉති කාතුං යනු කර්ම කාරකයට උදාහරණයි.

165 **භාවය:-** මෙසින් කිතක ප්‍රත්‍යයෝ සතිසක් දැක්වූහ.

**වණ්ණනා**:- අ-ණ-ණ්වු-තු-ආවී- ක්ඛී- රමම- ණ්- යු- රූ- ණුක-කර - තබ්බ - අනීය - ණ්‍ය - තෙය්‍ය - රිච්ච - යු - ති - අති - රිරිය - ත - තා - වී - තවන්තු - ඉත - බ - තවෙ - තුං - තුන - ත්වාන - ත්වා - අන්ත - රත්‍තු - රිතු - රාතු - තුකා යන මේ ප්‍රත්‍ය සතිස කිතක නාමයෙහි ඇතුළති. තය්‍ය ප්‍රත්‍යයද ගෙන ඇතැම් හු **"දිඨෙය්‍යං"** යනාදිය දක්වති. රත්‍තු ප්‍රත්‍යය ගාථායෙහි නො පැණෙතුදු මේ ගණයෙහිම ලා දැක්වූහ. මොවුන් විහිත සූත්‍රාදිය මෙහි නොදැක් වූයේ කාච්චා යනා දී ග්‍රන්ථයන් අවලොකනය කටයුතු හෙයිනි.

167 **භාවය**:- සත්ත්‍රිංශත් විධ ප්‍රත්‍යයන් සමග අකාර ප්‍රත්‍ය තුනක්ද, තු-ආවී යන ප්‍රත්‍ය දෙකද, රූ-ත, යන ප්‍රත්‍ය දෙකද යුතී ආදී ප්‍රත්‍ය තුන දැයි යන මේ ප්‍රත්‍යයන් එක්කොට ගිනූ කල අර්ථ වශයෙන් වන ප්‍රත්‍ය පන්සාළිසෙක් වේ.

168 ඒ සත්තිස් ප්‍රත්‍යයන් අතුරෙන් අ-ණ-ණී-තු-ආවී-රූ-ත-ණුක-ඉත-අන්ත-රිතු- යන මේ ප්‍රත්‍යය එකළොස කත්‍ර්‍ෘ වාචක වේ.

169 **භාවය**:- තබ්බ-අනීය-ණ්‍ය-රිච්ච-රිරිය යන මොවු හු භාව කර්මකාරක යන්හි වෙති. මාන ප්‍රත්‍යය කත්‍ර්‍ෘ කර්ම දෙක්හි යෙදෙයි.

170 **භාවය**:- ඉතිරි ප්‍රත්‍ය දහනව (19) ය කාරකත්‍රය යෙහි වෙති. තවෙ, තුං, තුන, ත්වාන, ත්වා යන ප්‍රත්‍යයෝ භාවයෙහි වෙති.

171 **භාවය**:- සුගමයි.

**වණ්ණනා**:- දැන් පවත්නා කාලය වර්තමානකාල ය යි. එහි කෘදන්ත විෂයෙහි වන **"අන්ත"** ප්‍රත්‍යය වර්තමාන කාලයෙහි වේ. **"භුජන්තො වාචං භාසති"** යන මෙහි **"භුජ"** ධාතුවෙන් පරව වර්තමාන කාලයෙහි **"අන්ත"** ප්‍රත්‍යය වීමෙන් **"භුජන්තො"**යයි සිඩ වී. ඉකුත් වූ කාලය අතීත කාලයයි. කෘදන්ත විෂයෙහි අතීත කාලාර්ථයෙහි ත, තවන්තු, තාවී යන ප්‍රත්‍යයෝ වෙති. **හුතො-හුතවා- හුතා** වී-යන උදාහරණයන්හි **"හු"** ධාතුයෙන් පරව අතීත කාලයෙහි යථොක්ත ප්‍රත්‍යය වීමෙන් ඒ පදයන්ගේ නිෂ්පත්තිය වේ. නොපැමිණි කාලය අනාගත කාලයයි. **"මාන"**

ප්‍රත්‍යය වර්තමාන අනාගත කාලයන්හි වේ. **මීනයමානො ගච්ඡති වුය්හමානො රුක්ඛො නස්සිස්සති.** යනු උදාහරණයි. සෙසු ප්‍රත්‍ය දෙතිස කාලත්‍රය යෙහිම වේ.

172 **භාෂ්‍යය:–** සාධන සතෙකි. කර්තෘ, කරණ, සම්ප්‍රදාන අපාදාන, අධිකරණ (ආධාර), කර්ම, භාව යන මොව්හු යි.

173 යමෙක් කර්තෘ ක්‍රියාව කරන්නේ ප්‍රසිද්ධියෙහි ම අවසාන ක්‍රියාව සොරේ ද? එය කර්තෘ සාධන නම්. කර්මාදි ෂට්කයද මේ ක්‍රමයෙන් ම දත යුතුයි.

**වණ්ණනා:–** යම් කාරකයක් වාක්‍යයෙහිදී ක්‍රියාවට කර්තෘව ක්‍රියාව නිපදවන අවස්ථාවෙහි ද ඒ කර්තෘත්වය ම ලබා නම් ඒ **කර්තෘ සාධනය** නම්. **පුරිසො ගෙහං ගතො. ඉත්ථී ගාමං ගතා** යනාදිය උදාහරණයි. කර්ම කාරකයත් එසේම වාක්‍යයෙහි දී ක්‍රියාවට කර්ම වේ. ඒ **කර්ම සාධන** නම්. **කිච්චං කාතබ්බං–කිං මෙ කරණීයං.** යනු උදාහරණයි.

සෙසු සාධන පවකයද මෙසේම දත යුතුයි.

174 **භාවය:–** සුගමයි.

**වණ්ණනා:–** යමෙක් මේ සාධනයට උදාහරණ කවරේ දැ යි විචාළ විට කර්තෘ, කර්ම, කරණාදි මේ සාධන පද උදාහරණ වශයෙන් දැක්වීම එයට ප්‍රමාණවේ. "කරොතීති=කත්තා" යන විග්‍රහයෙහි "කරොති" යන ක්‍රියාව කරන්නා **කර්තෘ සාධන** නැමැයි අනායාස යෙන් ම දැනගත හැකිවන නිසා මොවුන් ම මෙයට උදාහරණ බව දැක්වීම අතිශයින් උචිතම ය.

175 **භාවය:–** කර්තෘ සාධනය. උක්ත කර්තෘ සාධනය, අනුක්ත කර්තෘ සාධනය යි ද්විවිධ වේ. "බුද්ධො–තිස්සයො" යනු තදුදාහරණයි. සුද්ධ කර්තෘ, හෙතු කර්තෘ වශයෙන් ද මේ දෙපරිදි වන බව දත යුතුයි.

176 **භාවය:–** කර්තෘ සාධක විග්‍රහය ධාතු ධාත්වර්ථ වශයෙන්ද කිතක ආඛ්‍යාත පද වශයෙන් ද, කොටස් දෙකකට බෙද් "බුද්ධො–සත්ථා" යනු උදාහරණයි.

**වර්ණනා:–** **"සබ්බ ධම්මෙ බුජ්ඣතෙනා ති බුද්ධො"** යන මෙහි බුධ ධාතුව තමා පිළිබඳවම පවත්නා මූල ධාතුවෙන් කරනලද විග්‍රහය ඇති නිසා මේ විග්‍රහය **ධාතු විග්‍රහය** නම් වේ. වාක්‍ය යෙහි ස්ව ධාතුවෙන් නොව අන්‍ය ධාතුවක අර්ථයක් ගෙන විග්‍රහය කෙරේ නම් ඒ **ධාත්වර්ථ විග්‍රහ** නම් වේ. "කිලෙසා රයො' හිංසන්තී ති පි සත්‍වා යනු උදාහරණයි.

177 **භාවය:–** සුගමයි.

**වර්ණනා:–** කිත් ප්‍රත්‍යයෝ කිත් සංඥාවට අනුරූප වශයෙන් ඔවුන් කියන ලද කර්තෘ අර්ථයෙහි වෙති. කිච්ච ප්‍රත්‍යයො කිච්ච සංඥාවට අනුව භාව කර්ම සාධනවයෙහි යෙදිය යුත්තාහ. කිත කිච්ච ප්‍රත්‍යයෝ එම සංඥාවට අනුරූප වශයෙන් කර්තෘ, කර්ම, භාව යන අර්ථයන්හි විය යුත්තෝ ය.

178 **භාවය;–** මේ කිතක භෙද ප්‍රකාශ කළ පිණෙන් සැක දුරු කිරීමට සමර්ථයෙක් වෙම්වා. භවයක් භවයක් පාසා ලොභ ද්වෙෂ මොහ යන මොවුන් ක්‍රමයෙන් අඩුකරන්නෙක්ද වෙම්වා.

**රන්දෙඹෙ මහාචෛත්‍ය පිරිවෙන් වැසි**
**පාරුතොට ධම්මාරාම තිස්ස ස්වාමීන් වහන්සේ**
**විසින් සම්පාදිත**
**භාවාර්ථ කෞමුදී නම් වූ කාත්‍යායන භෙද වර්ණනාව**
**මෙතෙකින් නිමියේ ය.**

ශු
පරව
නිෂ්පතත

# සබ්බ දානං ධම්ම දානං ජිනාති

